# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

# ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
NETS

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

## ඇගයීම් වාර්තාව

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

සිංහල භාෂාව හා සාහිත්‍යය
ඇගයීම් වාර්තාව - අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2016

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) හා අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) මගිනි.

# හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරෙන් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මගින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තූතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2019 ජනවාරි 22
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| උපදේශනය | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| මෙහෙයවීම හා සංවිධානය | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| සම්බන්ධීකරණය | : | මනෝමි සෙනෙවිරත්න<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| විෂය සම්බන්ධීකරණය | : | බුද්ධිකා පෙරේරා<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br><br>පී. රුක්මල් මහේෂ් පෙරේරා<br>සහකාර විභාග කොමසාරිස් |
| සංස්කරණය | : | මහාචාර්ය රත්න විජේතුංග<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය<br><br>ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| සැකසුම් කමිටුව | : | ශ්‍රියානි අබේවික්‍රම<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>පී.ජේ. කළුආරච්චි<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>රත්නපුර<br><br>ඒ.එම්. කිත්සිරි පීරිස්<br>ගුරු උපදේශක<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය<br>පානදුර<br><br>පී.එම්. කුමුදුනී චන්ද්‍රකාන්ති<br>ගුරු සේවය I<br>බප/ගම්/යසෝදරාදේවි බාලිකා මහ විදුහල<br>ගම්පහ |
| පරිගණක පිටපත සැකසුම | : | කේ. ඒ. අයි. බණ්ඩාර<br>තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර II |
| පිටකවරය නිර්මාණය | : | එස්.එච්. සමන් කුමාර<br>රාජ්‍ය කළමනාකරණ සහකාර III |

# ඇතුළත පිටු

**පිටු අංකය**

**I කොටස**


1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 11
1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 11
1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 13
2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව) 19
2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරාගෙන ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 24
2.2.2 II ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 25

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය 39
2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 39

III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා
3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 56
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 57

# I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

* අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
* නිරවුල් ලිඛිත ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලබාදීම
* ජීවන වෘත්තීන්ට අදාළ ව භාෂාව ප්‍රායෝගිකව උපයෝගි කර ගැනීමේ කුසලතා වර්ධනය කිරීම
* සිංහල භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාර ධර්ම හා ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයුම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමෙන් ලබාගත් අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 220611 | 3848 | 224459 |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 54977 | 24.92 | 644 | 16.74 | 55621 | 24.78 |
| B | 40753 | 18.47 | 508 | 13.2 | 41261 | 18.38 |
| C | 56692 | 25.7 | 789 | 20.5 | 57481 | 25.61 |
| S | 39580 | 17.94 | 778 | 20.22 | 40358 | 17.98 |
| W | 28609 | 12.97 | 1129 | 29.34 | 29738 | 13.25 |
| **එකතුව** | **220611** | **100.00** | **3848** | **100.00** | **224459** | **100.00** |

වගුව 2

### 1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 28854 | 9503 | 32.93 | 5159 | 17.88 | 6372 | 22.08 | 4281 | 14.84 | 25315 | 87.73 | 3539 | 12.27 |
| 2. ගම්පහ | 26601 | 6918 | 26.01 | 4859 | 18.27 | 6409 | 24.09 | 4585 | 17.24 | 22771 | 85.60 | 3830 | 14.40 |
| 3. කළුතර | 14103 | 3761 | 26.67 | 2618 | 18.56 | 3420 | 24.25 | 2476 | 17.56 | 12275 | 87.04 | 1828 | 12.96 |
| 4. මහනුවර | 15643 | 4026 | 25.74 | 2855 | 18.25 | 4094 | 26.17 | 2852 | 18.23 | 13827 | 88.39 | 1816 | 11.61 |
| 5. මාතලේ | 5825 | 1083 | 18.59 | 987 | 16.94 | 1683 | 28.89 | 1193 | 20.48 | 4946 | 84.91 | 879 | 15.09 |
| 6. නුවරඑළිය | 4660 | 806 | 17.30 | 831 | 17.83 | 1368 | 29.36 | 990 | 21.24 | 3995 | 85.73 | 665 | 14.27 |
| 7. ගාල්ල | 14502 | 4277 | 29.49 | 2754 | 18.99 | 3484 | 24.02 | 2325 | 16.03 | 12840 | 88.54 | 1662 | 11.46 |
| 8. මාතර | 11066 | 3089 | 27.91 | 2119 | 19.15 | 2856 | 25.81 | 1864 | 16.84 | 9928 | 89.72 | 1138 | 10.28 |
| 9. හම්බන්තොට | 8627 | 2149 | 24.91 | 1741 | 20.18 | 2168 | 25.13 | 1512 | 17.53 | 7570 | 87.75 | 1057 | 12.25 |
| 10. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13. වව්නියාව | 256 | 38 | 14.84 | 40 | 15.63 | 59 | 23.05 | 58 | 22.66 | 195 | 76.17 | 61 | 23.83 |
| 14. මුලතිව් | 92 | 7 | 7.61 | 11 | 11.96 | 37 | 40.22 | 20 | 21.74 | 75 | 81.52 | 17 | 18.48 |
| 15. මඩකලපුව | 1499 | 373 | 24.88 | 253 | 16.88 | 416 | 27.75 | 353 | 23.55 | 1395 | 93.06 | 104 | 6.94 |
| 16. අම්පාර | 3915 | 589 | 15.04 | 672 | 17.16 | 1094 | 27.94 | 899 | 22.96 | 3254 | 83.12 | 661 | 16.88 |
| 17. ත්‍රිකුණාමලය | 1166 | 207 | 17.75 | 187 | 16.04 | 328 | 28.13 | 209 | 17.92 | 950 | 81.48 | 235 | 20.15 |
| 18. කුරුණෑගල | 21197 | 5344 | 25.21 | 4218 | 19.90 | 5715 | 26.96 | 3795 | 17.90 | 19072 | 89.97 | 2125 | 10.03 |
| 19. පුත්තලම | 8196 | 1639 | 20.00 | 1400 | 17.08 | 2265 | 27.64 | 1672 | 20.40 | 6976 | 85.11 | 1220 | 14.89 |
| 20. අනුරාධපුරය | 12148 | 2343 | 19.29 | 2123 | 17.48 | 3305 | 27.21 | 2590 | 21.32 | 10361 | 85.29 | 1787 | 14.71 |
| 21. පොළොන්නරුව | 5344 | 797 | 14.91 | 910 | 17.03 | 1516 | 28.37 | 1160 | 21.71 | 4383 | 82.02 | 961 | 17.98 |
| 22. බදුල්ල | 8763 | 1998 | 22.80 | 1713 | 19.55 | 2436 | 27.80 | 1604 | 18.30 | 7751 | 88.45 | 1012 | 11.55 |
| 23. මොනරාගල | 6051 | 1014 | 16.76 | 1087 | 17.96 | 1690 | 27.93 | 1277 | 21.10 | 5068 | 83.75 | 983 | 16.25 |
| 24. රත්නපුරය | 12708 | 2864 | 22.54 | 2392 | 18.82 | 3447 | 27.12 | 2318 | 18.24 | 11021 | 86.72 | 1687 | 13.28 |
| 25. කෑගල්ල | 9823 | 2405 | 24.48 | 1880 | 19.14 | 2614 | 26.61 | 1680 | 17.10 | 8579 | 87.34 | 1244 | 12.66 |
| **සමස්ත දිවයින** | **221039** | **55230** | **24.99** | **40809** | **18.46** | **66660** | **28.34** | **45449** | **19.32** | **208992** | **88.85** | **26236** | **11.15** |

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

| අධ්‍යාපන කලාප | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 11686 | 4704 | 40.25 | 1871 | 16.01 | 2203 | 18.85 | 1483 | 12.69 | 10261 | 87.81 | 1425 | 12.19 |
| 2. හෝමාගම | 4238 | 1148 | 27.09 | 791 | 18.66 | 1001 | 23.62 | 689 | 16.26 | 3629 | 85.63 | 609 | 14.37 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 7318 | 2156 | 29.46 | 1404 | 19.19 | 1785 | 24.39 | 1190 | 16.26 | 6535 | 89.3 | 783 | 10.7 |
| 4. පිළියන්දල | 5612 | 1495 | 26.64 | 1093 | 19.48 | 1383 | 24.64 | 919 | 16.38 | 4890 | 87.13 | 722 | 12.87 |
| 5. ගම්පහ | 7567 | 2609 | 34.48 | 1432 | 18.92 | 1598 | 21.12 | 1080 | 14.27 | 6719 | 88.79 | 848 | 11.21 |
| 6 මිනුවන්ගොඩ | 5098 | 1007 | 19.75 | 938 | 18.4 | 1313 | 25.76 | 1007 | 19.75 | 4265 | 83.66 | 833 | 16.34 |
| 7. මීගමුව | 6889 | 1442 | 20.93 | 1147 | 16.65 | 1759 | 25.53 | 1339 | 19.44 | 5687 | 82.55 | 1202 | 17.45 |
| 8. කැලණිය | 7047 | 1860 | 26.39 | 1342 | 19.04 | 1739 | 24.68 | 1159 | 16.45 | 6100 | 86.56 | 947 | 13.44 |
| 9. කළුතර | 6744 | 1820 | 26.99 | 1213 | 17.99 | 1571 | 23.29 | 1211 | 17.96 | 5815 | 86.22 | 929 | 13.78 |
| 10. මතුගම | 2920 | 809 | 27.71 | 573 | 19.62 | 769 | 26.34 | 492 | 16.85 | 2643 | 90.51 | 277 | 9.49 |
| 11. හොරණ | 4439 | 1132 | 25.5 | 832 | 18.74 | 1080 | 24.33 | 773 | 17.41 | 3817 | 85.99 | 622 | 14.01 |
| 12. නුවර | 6426 | 2577 | 40.1 | 1191 | 18.53 | 1384 | 21.54 | 788 | 12.26 | 5940 | 92.44 | 486 | 7.56 |
| 13. දෙනුවර | 1454 | 225 | 15.47 | 262 | 18.02 | 428 | 29.44 | 333 | 22.9 | 1248 | 85.83 | 206 | 14.17 |
| 14. ගම්පොළ | 2240 | 315 | 14.06 | 372 | 16.61 | 633 | 28.26 | 520 | 23.21 | 1840 | 82.14 | 400 | 17.86 |
| 15. තෙල්දෙනිය | 1535 | 173 | 11.27 | 247 | 16.09 | 449 | 29.25 | 368 | 23.97 | 1237 | 80.59 | 298 | 19.41 |
| 16. වත්තේගම | 1787 | 259 | 14.49 | 327 | 18.3 | 563 | 31.51 | 424 | 23.73 | 1573 | 88.02 | 214 | 11.98 |
| 17. කටුගස්තොට | 2201 | 477 | 21.67 | 456 | 20.72 | 637 | 28.94 | 419 | 19.04 | 1989 | 90.37 | 212 | 9.63 |
| 18. මාතලේ | 2620 | 720 | 27.48 | 467 | 17.82 | 695 | 26.53 | 445 | 16.98 | 2327 | 88.82 | 293 | 11.18 |
| 19. ගලේවෙල | 2199 | 234 | 10.64 | 360 | 16.37 | 701 | 31.88 | 520 | 23.65 | 1815 | 82.54 | 384 | 17.46 |
| 20. නාඋල | 489 | 53 | 10.84 | 88 | 18 | 142 | 29.04 | 112 | 22.9 | 395 | 80.78 | 94 | 19.22 |
| 21. විල්ගමුව | 517 | 76 | 14.7 | 72 | 13.93 | 145 | 28.05 | 116 | 22.44 | 409 | 79.11 | 108 | 20.89 |
| 22. නුවරඑළිය | 701 | 83 | 11.84 | 103 | 14.69 | 197 | 28.1 | 192 | 27.39 | 575 | 82.03 | 126 | 17.97 |
| 23. කොත්මලේ | 767 | 168 | 21.9 | 142 | 18.51 | 227 | 29.6 | 143 | 18.64 | 680 | 88.66 | 87 | 11.34 |
| 24. හැටන් | 757 | 110 | 14.53 | 142 | 18.76 | 236 | 31.18 | 154 | 20.34 | 642 | 84.81 | 115 | 15.19 |
| 25. වලපනේ | 866 | 140 | 16.17 | 152 | 17.55 | 250 | 28.87 | 191 | 22.06 | 733 | 84.64 | 133 | 15.36 |
| 26. හඟුරන්කෙත | 1569 | 305 | 19.44 | 292 | 18.61 | 458 | 29.19 | 310 | 19.76 | 1365 | 87 | 204 | 13 |
| 27. ගාල්ල | 6639 | 2417 | 36.41 | 1287 | 19.39 | 1407 | 21.19 | 880 | 13.26 | 5991 | 90.24 | 648 | 9.76 |
| 28. ඇල්පිටිය | 3008 | 649 | 21.58 | 573 | 19.05 | 840 | 27.93 | 547 | 18.18 | 2609 | 86.74 | 399 | 13.26 |
| 29. අම්බලන්ගොඩ | 3177 | 816 | 25.68 | 562 | 17.69 | 800 | 25.18 | 573 | 18.04 | 2751 | 86.59 | 426 | 13.41 |
| 30. උඩුගම | 1678 | 395 | 23.54 | 332 | 19.79 | 437 | 26.04 | 325 | 19.37 | 1489 | 88.74 | 189 | 11.26 |
| 31. මාතර | 5032 | 1663 | 33.05 | 929 | 18.46 | 1148 | 22.81 | 773 | 15.36 | 4513 | 89.69 | 519 | 10.31 |
| 32. අකුරැස්ස | 1878 | 496 | 26.41 | 355 | 18.9 | 515 | 27.42 | 341 | 18.16 | 1707 | 90.89 | 171 | 9.11 |
| 33. මුලටියන-හක්මන | 2122 | 504 | 23.75 | 430 | 20.26 | 584 | 27.52 | 378 | 17.81 | 1896 | 89.35 | 226 | 10.65 |
| 34. මොරවක-දෙනියාය | 2034 | 426 | 20.94 | 405 | 19.91 | 609 | 29.94 | 372 | 18.29 | 1812 | 89.09 | 222 | 10.91 |

| අධ්‍යාපන කලාප | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 35. තංගල්ල | 2432 | 645 | 26.52 | 476 | 19.57 | 605 | 24.88 | 419 | 17.23 | 2145 | 88.2 | 287 | 11.8 |
| 36. හම්බන්තොට | 3720 | 764 | 20.54 | 733 | 19.7 | 977 | 26.26 | 680 | 18.28 | 3154 | 84.78 | 566 | 15.22 |
| 37. වලස්මුල්ල | 2475 | 740 | 29.9 | 532 | 21.49 | 586 | 23.68 | 413 | 16.69 | 2271 | 91.76 | 204 | 8.24 |
| 38. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 39. දූපත් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 40. තෙන්මාරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 41. වලිකාමම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 42. වඩමරච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 43. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 44. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 45. මඩු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 46. වව්නියාව | 256 | 38 | 14.84 | 40 | 15.63 | 59 | 23.05 | 58 | 22.66 | 195 | 76.17 | 61 | 23.83 |
| 47. වව්නියාව උතුර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 48. මුලතිව් | 92 | 7 | 7.61 | 11 | 11.96 | 37 | 40.22 | 20 | 21.74 | 75 | 81.52 | 17 | 18.48 |
| 49. තුනුක්කායි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 50. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 51. කල්කුඩා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 52. පඩිරිප්පු | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 53. මඩකලපුව මධ්‍යම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 54. අම්පාර | 2423 | 485 | 20.02 | 444 | 18.32 | 620 | 25.59 | 500 | 20.64 | 2049 | 84.56 | 374 | 15.44 |
| 55. කල්මුනේ | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 56. සමන්තුරෙයි | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 3 | 100 |
| 57. මහඔය | 586 | 49 | 8.36 | 72 | 12.29 | 202 | 34.47 | 152 | 25.94 | 475 | 81.06 | 111 | 18.94 |
| 58. දෙහිඅත්තකණ්ඩිය | 906 | 55 | 6.07 | 156 | 17.22 | 272 | 30.02 | 245 | 27.04 | 728 | 80.35 | 178 | 19.65 |
| 59. තිරුක්කෝවිල් | 5 | 0 | 0 | 0 | 0 | 1 | 20 | 2 | 40 | 3 | 60 | 2 | 40 |
| 60. අක්කරෙයිපත්තුව | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 100 |
| 61. ත්‍රිකුණාමලය | 324 | 42 | 12.96 | 44 | 13.58 | 110 | 33.95 | 61 | 18.83 | 257 | 79.32 | 67 | 20.68 |
| 62. මුතූර් | 2 | 0 | 0 | 0 | 0 | 2 | 100 | 0 | 0 | 2 | 100 | 0 | 0 |
| 63. කන්තලේ | 756 | 157 | 20.77 | 134 | 17.72 | 199 | 26.32 | 119 | 15.74 | 609 | 80.56 | 147 | 19.44 |
| 64. ත්‍රිකුණාමලය (උතුර) | 365 | 22 | 6.03 | 48 | 13.15 | 99 | 27.12 | 85 | 23.29 | 254 | 69.59 | 111 | 30.41 |
| 65. කින්නියා | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 66. කුරුණෑගල | 5373 | 1769 | 32.92 | 1060 | 19.73 | 1217 | 22.65 | 786 | 14.63 | 4832 | 89.93 | 541 | 10.07 |
| 67. කුලියාපිටිය | 3712 | 1040 | 28.02 | 734 | 19.77 | 1023 | 27.56 | 646 | 17.4 | 3443 | 92.75 | 269 | 7.25 |
| 68. නිකවැරටිය | 2788 | 580 | 20.8 | 582 | 20.88 | 883 | 31.67 | 524 | 18.79 | 2569 | 92.14 | 219 | 7.86 |

| අධ්‍යාපන කලාප | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | දුර්වල (W) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 69. මහව | 3494 | 592 | 16.94 | 691 | 19.78 | 1048 | 29.99 | 746 | 21.35 | 3077 | 88.07 | 417 | 11.93 |
| 70. ගිරිඋල්ල | 3287 | 768 | 23.36 | 680 | 20.69 | 870 | 26.47 | 600 | 18.25 | 2918 | 88.77 | 369 | 11.23 |
| 71. ඉබ්බාගමුව | 2757 | 641 | 23.25 | 511 | 18.53 | 717 | 26.01 | 535 | 19.41 | 2404 | 87.2 | 353 | 12.8 |
| 72. පුත්තලම | 3070 | 399 | 13 | 486 | 15.83 | 873 | 28.44 | 729 | 23.75 | 2487 | 81.01 | 583 | 18.99 |
| 73. හලාවත | 5251 | 1262 | 24.03 | 930 | 17.71 | 1418 | 27 | 977 | 18.61 | 4587 | 87.35 | 664 | 12.65 |
| 74. අනුරාධපුරය | 4361 | 1065 | 24.42 | 768 | 17.61 | 1051 | 24.1 | 860 | 19.72 | 3744 | 85.85 | 617 | 14.15 |
| 75. තඹුත්තේගම | 2406 | 371 | 15.42 | 434 | 18.04 | 760 | 31.59 | 517 | 21.49 | 2082 | 86.53 | 324 | 13.47 |
| 74. කැකිරාව | 2219 | 448 | 20.19 | 357 | 16.09 | 596 | 26.86 | 477 | 21.5 | 1878 | 84.63 | 341 | 15.37 |
| 75. ගලෙන්බිඳුණුවැව | 1437 | 214 | 14.89 | 261 | 18.16 | 419 | 29.16 | 339 | 23.59 | 1233 | 85.8 | 204 | 14.2 |
| 76. කැබිතිගොල්ලෑව | 1765 | 246 | 13.94 | 306 | 17.34 | 488 | 27.65 | 411 | 23.29 | 1451 | 82.21 | 314 | 17.79 |
| 77. පොළොන්නරුව | 1490 | 305 | 20.47 | 318 | 21.34 | 365 | 24.5 | 246 | 16.51 | 1234 | 82.82 | 256 | 17.18 |
| 78. හිඟුරක්ගොඩ | 2504 | 387 | 15.46 | 398 | 15.89 | 722 | 28.83 | 557 | 22.24 | 2064 | 82.43 | 440 | 17.57 |
| 79. දිඹුලාගල | 1364 | 105 | 7.7 | 194 | 14.22 | 430 | 31.52 | 360 | 26.39 | 1089 | 79.84 | 275 | 20.16 |
| 80. බදුල්ල | 1957 | 546 | 27.9 | 423 | 21.61 | 511 | 26.11 | 314 | 16.04 | 1794 | 91.67 | 163 | 8.33 |
| 81. බණ්ඩාරවෙල | 2400 | 790 | 32.92 | 497 | 20.71 | 615 | 25.63 | 314 | 13.08 | 2216 | 92.33 | 184 | 7.67 |
| 82. මහියංගනය | 1890 | 286 | 15.13 | 307 | 16.24 | 501 | 26.51 | 432 | 22.86 | 1526 | 80.74 | 364 | 19.26 |
| 83. වැලිමඩ | 1992 | 285 | 14.31 | 375 | 18.83 | 658 | 33.03 | 440 | 22.09 | 1758 | 88.25 | 234 | 11.75 |
| 84. පස්සර | 559 | 96 | 17.17 | 114 | 20.39 | 160 | 28.62 | 111 | 19.86 | 481 | 86.05 | 78 | 13.95 |
| 85. වියලුව | 794 | 106 | 13.35 | 158 | 19.9 | 251 | 31.61 | 164 | 20.65 | 679 | 85.52 | 115 | 14.48 |
| 86. මොනරාගල | 1864 | 307 | 16.47 | 308 | 16.52 | 541 | 29.02 | 388 | 20.82 | 1544 | 82.83 | 320 | 17.17 |
| 87. වැල්ලවාය | 2710 | 442 | 16.31 | 467 | 17.23 | 734 | 27.08 | 606 | 22.36 | 2249 | 82.99 | 461 | 17.01 |
| 88. බිබිල | 1478 | 265 | 17.93 | 312 | 21.11 | 416 | 28.15 | 283 | 19.15 | 1276 | 86.33 | 202 | 13.67 |
| 89. රත්නපුර | 5450 | 1612 | 29.58 | 997 | 18.29 | 1343 | 24.64 | 820 | 15.05 | 4772 | 87.56 | 678 | 12.44 |
| 90. බලන්ගොඩ | 2254 | 354 | 15.71 | 428 | 18.99 | 655 | 29.06 | 502 | 22.27 | 1939 | 86.02 | 315 | 13.98 |
| 91. නිවිතිගල | 1926 | 323 | 16.77 | 384 | 19.94 | 566 | 29.39 | 405 | 21.03 | 1678 | 87.12 | 248 | 12.88 |
| 92. ඇඹිලිපිටිය | 3198 | 595 | 18.61 | 596 | 18.64 | 908 | 28.39 | 621 | 19.42 | 2720 | 85.05 | 478 | 14.95 |
| 93. කෑගල්ල | 4146 | 1217 | 29.35 | 843 | 20.33 | 1009 | 24.34 | 625 | 15.07 | 3694 | 89.1 | 452 | 10.9 |
| 94. මාවනැල්ල | 2889 | 598 | 20.7 | 503 | 17.41 | 811 | 28.07 | 553 | 19.14 | 2465 | 85.32 | 424 | 14.68 |
| 95. දෙහිඕවිට | 2840 | 593 | 20.88 | 539 | 18.98 | 809 | 28.49 | 518 | 18.24 | 2459 | 86.58 | 381 | 13.42 |
| **සමස්ත දිවයින** | **224459** | **55621** | **24.78** | **41261** | **18.38** | **57481** | **25.61** | **40358** | **17.98** | **194719** | **86.75** | **29738** | **13.25** |

වගුව 4

### 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 1070 | 0.48 | 224459 | 100 |
| 81 - 90 | 19850 | 8.84 | 223389 | 99.52 |
| 71 - 80 | 37570 | 16.74 | 203539 | 90.68 |
| 61 - 70 | 42298 | 18.84 | 165969 | 73.94 |
| 51 - 60 | 40827 | 18.19 | 123671 | 55.10 |
| 41 - 50 | 30790 | 13.72 | 82844 | 36.91 |
| 31 - 40 | 23843 | 10.62 | 52054 | 23.19 |
| 21 - 30 | 15969 | 7.11 | 28211 | 12.57 |
| 11 - 20 | 8922 | 3.97 | 12242 | 5.45 |
| 01 - 10 | 3310 | 1.47 | 3320 | 1.48 |
| 00 - 00 | 10 | 0.00 | 10 | 0.00 |

**වගුව 5**

ඉහත වගුවට අනුව සිංහල භාෂාව හා සාහිත්‍ය විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් 224459 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 23843 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 10.62% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 52054 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 23.19% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය


### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 1 ප්‍රශ්නයටයි. එහි ප්‍රතිශතය 95% කි. එමෙන් ම අයදුම්කරුවන් අඩු ම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 8 ප්‍රශ්නයට යි. එහි ප්‍රතිශතය 19% කි.


### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් මෙම ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර දක්වා ඇති අයදුම්කරුවන්ගෙන් 99%ක් පිළිතුරු සපයා තිබූ අතර අඩු ම සංඛ්‍යාවක් ප්‍රතිචාර දක්වා ඇති අංක 5 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 92%ක් පමණි.

**ප්‍රස්තාරය 2** (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 18% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 00 සිට 05 තෙක් ලබාගත් ප්‍රතිශතය 19% කි.

**ප්‍රස්තාරය 3** (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

II පත්‍රයෙහි ප්‍රශ්න 5න් ලකුණු 16-20 ප්‍රාන්තරයේ වැඩි ම ලකුණු ලබාගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නය සඳහා ය. එය හරි අඩකට මදක් වැඩි ප්‍රමාණයකි. එනම් 51%ක් පමණි.


### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 4** (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව, අංක 1 ප්‍රශ්නයෙහි (iv) කොටසෙහි පහසුතාව 76%කි. එමෙන්ම අඩු ම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (v) කොටසටයි. එහි පහසුතා 22%කි.


### 1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද මෙම ප්‍රස්තාරයට අනුව අංක 1 ප්‍රශ්නය සඳහා 99%ක් ද අංක 4 ප්‍රශ්නය සඳහා 83%ක් ද පිළිතුරු සපයා ඇත. අංක 5, 6, 7 අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අංක 5 ප්‍රශ්නය සඳහා 50%ක් ද, අංක 6 සහ අංක 7 ප්‍රශ්න සඳහා පිළිවෙළින් 15%, 25%ක් වශයෙන් පිළිතුරු සපයා ඇත.

**ප්‍රස්තාරය 5** (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

### 1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය





අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න්, මෙම ප්‍රස්තාරයට අනුව, 76% - 100% ප්‍රාන්තරයේහි එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබාගත් ප්‍රතිශතය 36% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 00 සිට 05 තෙක් ලබාගත් ප්‍රතිශතය 16% කි.

ප්‍රස්තාරය 6 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

5, 6, 7 ප්‍රශ්න අතුරෙන් අයදුම්කරුවන්ට කැපී පෙනෙන ලෙස ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගැනීමට හැකි වී ඇත්තේ 7 වන ප්‍රශ්නය සඳහා ය. එම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු 10න්, ලකුණු 6ක් හෝ ඊට වැඩියෙන් ලබා ඇති ප්‍රතිශතය 81%ක් පමණ වේ. එනම් 7 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හරි අඩකටත් වඩා ලකුණු 6 හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇත.

## 1.3.6 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




**ප්‍රස්තාරය 7** (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයට අනුව, වැඩිම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයෙහි (i) (ආ) අනුකොටසටය. එහි පහසුතාව 81%කි. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iv) කොටසට යි. එහි පහසුතාව 21%කි.

## II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරින් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙකම අපේක්ෂකයින්ට එක වර දෙනු ලබන අතර එම පත්‍ර දෙකම සඳහා නියමිත කාලය පැය තුනකි. සිංහල සාහිත්‍යය ආශ්‍රිත කුසලතා මැනීම සඳහා වෙනම දෙනු ලබන III පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි.

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | | | |
|---|---|---|---|---|
| I | පත්‍රය සඳහා | - | ලකුණු | 40 |
| II | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| III | පත්‍රය සඳහා | - | ලකුණු | 80 |
| | එකතුව | - | ලකුණු | 200 |

අවසාන ලකුණ - 200 ÷ 2 = 100

## 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

II පත්‍රය - කාලය පැය 02යි. ප්‍රශ්න 05කි. (මුළු ලකුණු 80කි.)
ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| 1 ප්‍රශ්නය | : | කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20කි. | | |
| 2 ප්‍රශ්නය | : | රචනා ලිවීම. | | ලකුණු 25කි. |
| | | (නිර්දිෂ්ට ව්‍යුහගත තේමා 4ක් අතුරෙන් එකක් තෝරා ගත යුතු ය.) | | |
| 3 ප්‍රශ්නය | : | සාරාංශකරණය | : | ලකුණු 10කි. |
| 4 ප්‍රශ්නය | : | අවබෝධය | : | ලකුණු 10කි. |
| 5 ප්‍රශ්නය | : | ප්‍රායෝගික ලේඛනය | : | ලකුණු 15කි. |
| | | (වෛකල්පික ප්‍රශ්න කොටස් දෙකකින් එකකට පමණක් පිළිතුරු | | |

### 2.1.2 I ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** නැඟී සිටින්නට වෙර දරන අයට **අත දීම** හොඳ පුරුද්දකි.
(1) ප්‍රශංසා කිරීම (2) උදවු කිරීම
(3) මිල මුදල් දීම (4) අගය කිරීමට ලක් කිරීම

**2.** ගුරුවරු දරුවන් වෙත **ඇහැ ගහගෙන** බලා සිටිති.
(1) සෝදිසියෙන් යුතුව (2) කරබාගෙන
(3) අනුකම්පාවෙන් (4) දැස් දල්වාගෙන

**3.** ප්‍රධානියාගේ **මුනිවත රැකීම** සේවකයන්ට ප්‍රහේලිකාවක් විය.
(1) ආගම සිහි කිරීම (2) දැස් පියාගෙන සිටීම
(3) නිශ්ශබ්දව සිටීම (4) කලබලකාරී වීම

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමග පොත්පත් .............................. ව්‍යාප්ත වන්නට විය.
(1) අවකාශය (2) විකාශනය (3) ප්‍රකාශනය (4) විකාශය

**5.** ශ්‍රී මහා බෝධි වෘක්ෂය පරිත්‍යාග කරන ලද්දේ දේවානම් පියතිස්ස රජුට ........................ ඉන්දියානු පාලකයා වූ අශෝක රජු විසිනි.
(1) අර්ධකාලීන (2) සමකාලීන (3) පශ්චාත්කාලීන (4) යාවත්කාලීන

**6.** සාහිත්‍ය නිර්මාණයක් තුළ අපූර්වත්වයක් ද ..................... ද පැවතිය යුතු ය.
(1) අර්ථාන්විතභාවයක් (2) විස්මිතභාවයක් (3) සමලංකෘතභාවයක් (4) කරුණාන්විතභාවයක්

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කහවණු, කස්තුරි, කාටිලේජ, කැඩපත (2) ජනාධිපති, ජනප්‍රවාද, ජලජ, ජාතිකාභිමානය
(3) තරලය, තරුණ, තලතුනා, තානාපති (4) පලාපල, පාචනය, පාවාඩය, පාරිභෝගික

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ස්වාභාවික, ආධ්‍යාත්මික, ප්‍රස්තාවනාව, අවස්ථෝචිත
(2) ව්‍යංග්‍යාර්ථය, විද්‍යාමාන, නීත්‍යානුකූල, කොට්ඨාසය
(3) නිශ්ශබ්දතාව, ප්‍රේම වෘතාන්තය, දන්ත ශල්‍යාගාරය, අත්‍යවශ්‍ය
(4) පුස්තකාලය, න්‍යෂ්ටික ප්‍රහාරය, යුධ රහස්, විද්‍යුත් උපකරණ

**9.** එක් එක් වචනවල මුලකුරෙහි **ඇදය**, **දීර්ඝ පාපිල්ල**, **ඉස්පිල්ල** සහ **ඇලපිල්ල** පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.
(1) කැත්ත, කුල්ල, මිට, කාලය (2) වැලි, නූල, ගිරය, කාලය
(3) දෙබල, මුල්ල, දූපත, වැට (4) ගෙදර, රූපය, මී කිරි, මාලය

**10.** 'අනවශ්‍ය' යන වචනය අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය. (2) විභක්ති සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය. (4) අව්‍යය සමාසයට ය.

**11.** "පොලිස් නිලධාරීන් විසින් සිදුකරන ලද මෙහෙයුමේ දී සොරුන් පැනගිය ද සොරාගත් භාණ්ඩ සොයා ගැනිණි." යන වාක්‍යයේ උක්තය වන්නේ,
(1) සොරාගත් භාණ්ඩ ය. (2) මෙහෙයුමේ දී ය.
(3) පොලිස් නිලධාරීන් ය. (4) සොරුන් ය.

**12.** මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදි ව දැක්වෙන්නේ කෙසේ ද?
(1) මිනි + සාගේ (2) මිනිසා + ගේ (3) මිනිස් + ආගේ (4) මිනිසා + අගේ

**13.** "නිලධාරීන් විසින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන ලදි." යන වාක්‍යයේ 'නිලධාරීන්' යන පදය අයත් වන විභක්තිය වන්නේ,
(1) ප්‍රථමා ය. (2) කර්තෘ ය. (3) කර්ම ය. (4) කරණ ය.

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

**14.** සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා යහපත් හා සේවයට කැපවූ ගුරු පරපුරක් බිහිකිරීමෙහිලා **පුරෝගාමී විය**.
(1) මුල් විය (2) නිරත විය (3) උත්සාහවන්ත විය (4) ඉදිරිපත් විය

**15.** භාෂාවේ විවිධ ස්වරූප **සුසංයෝජනයෙන්** කාව්‍යෝක්ති නිර්මාණය කර ගැනීමට කවීහු උත්සාහ කරති.
(1) මනාව සංස්කරණය කිරීමෙන් (2) අවබෝධයෙන් යුතුව යෙදීමෙන්
(3) ප්‍රකට ලෙස යොදා ගැනීමෙන් (4) මැනවින් සම්බන්ධ කර ගැනීමෙන්

**16.** විභාග ප්‍රතිඵල දැකීමෙන් ඔහු තුළ ඇති වූ **ප්‍රහර්ෂය** මුහුණේ පිළිබිඹු ව තිබිණි.
(1) දුක්ඛදායක තත්ත්වය (2) අධික සන්තෝෂය
(3) බියට පත්වූ බව (4) කලබලයට පත්වූ ස්වභාවය

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) නිපාත - සේ, එහෙත්, විසින්, බඳු
(2) කෘදන්ත - ලියුම, තිබුණු, වැටීම, දුවන්නා
(3) තද්ධිත - ජාතික, ධෛර්යවත්, ආයතනික, ස්වදේශීය
(4) උපසර්ග - ප, පර, සිරි, නි

**18.** යමක් වර්ණනා කිරීම, විස්තර කිරීම, ස්වභාවය දැක්වීම සඳහා යෙදෙන පද
(1) කෘදන්ත පදයි. (2) තද්ධිත පදයි. (3) නාම පදයි. (4) විශේෂණ පදයි.

**19.** එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
(1) ඉක්මන් - සෙද, පොත - ගත, නිතර - නිබඳ, රත්තරන් - රුවන්
(2) මුහුණ - වත, භයානක - භීම, වීදිය - වේ, අඹ - ජලය
(3) සඳ - සිසි, සිරුර - වෙර, මහත - ස්ථූල, ලණුව - යොත
(4) අශ්වයා - හය, කුරුල්ලා - සකුණ, උතුම් - පවර, උවදුර - පිරිපත

**20.** 'ඉරබටු තරුව' හැඳින්වීම සඳහා යෙදෙන නමක් **නො වන්නේ** කුමක් ද?
(1) ඕෂධී තාරකාව (2) දවහත් තරුව (3) සැඳෑ තරුව (4) නගුල් තරුව

**21.** විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** කුමක් ද?
(1) අනුමාන - ප්‍රත්‍යක්ෂ (2) අභියස - පිටුපස
(3) ප්‍රච්ඡන්න - විවෘත (4) නිපුණ - ප්‍රවීණ

**22.** පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) වෙළෙන්දා සේවකයා ලවා කඩය පිරිසිදු කරවයි.
(2) ඔහු නින්දට යද්දී වැස්ස පටන් ගත්තේ ය.
(3) තාරිකා දුරකථනය අතට ගෙන පරීක්ෂා කළා ය.
(4) සමන් සිනා සිසී මා දෙස බැලුවේ ය.

**23.** **වැරදි** අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) පිල්ලම් භාවිතයේ දී ඖ ස්වරය නියෝජනය කිරීම සඳහා ව්‍යංජන අක්ෂර සමග කොම්බුව සහ ගයනුකිත්ත භාවිත කෙරේ.
(2) කණ්ඨජ අක්ෂර යනුවෙන් හඳුන්වන්නේ දිවේ පසු කොටස උගුර දෙසට ළංවීමෙන් උපදින ශබ්දයි.
(3) ක්‍රීඩා කරද්දී යනු අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.
(4) "වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කෙරෙති." යන වාක්‍යයේ රෝගීහු යනු උක්ත කර්මයයි.

**24.** පූර්ව ස්වර ලෝප සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?
(1) නියංසාය (2) සුරත (3) නිරවුල් (4) මලසුන

**25.** දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) කු දා ව ස න (2) ය පු ලි ජා න (3) ර මා අ තු ස (4) ණ බු ර ත් ස

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

**26.** එක් කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම
(1) අලි මදිවට හරක් (2) දී කිරට බළල්ලුත් සාක්කි
(3) අනුන්ට කැපූ වලේ තමනුත් වැටේ (4) උඩ පැන්නොත් බිම වැටේ

**27.** තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම
(1) සෙක්කුවේ බැන්ද හරකා වගේ (2) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
(3) අතු කඩා මොර කන්නා වගේ (4) පාරුකාරයාගේ උම්බලකඩේ වගේ

**28.** A - විස්මයාවහ - පුදුමයෙන් තොරව
B - සිවු සඟරාවත - දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
C - කෝ ගිනි කඳ - කෝපය නම් ගිනි ජාලාව
D - දෑවුරුදු - දෙ + අවුරුදු
A, B, C, D යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, C හා D පමණි. (4) B, C හා D පමණි.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූල ව නිවැරදි** වාක්‍යය තෝරන්න.

**29.** (1) ගුරුවරුන්ගේ මෙහෙවර ඇගයෙති. (2) හොඳ ළමයි ප්‍රශංසාවට ලක්වනු ඇත.
(3) මම සංචාරකයෝ සමග මිත්‍ර වීමි. (4) ඔහු දෙවියකු වැනි මිනිසෙක් ය.

**30.** (1) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි.
(2) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා ප්‍රවීණ සිනමාකරුවෙකුලු.
(3) සමහර මිනිස්සු අවංක නො වන්නේ ඇයි දැයි මට නොතේරේ.
(4) ඔවුන් තරගයට හොඳින් මුහුණ දුන්හයි ගුරුතුමිය පැවසුවා ය.

**31.** A - ජනාධිපතිතුමා .............................. අගමැතිතුමා සමුළුවට සහභාගි වෙයි.
B - .............................. කතා කරන්න. මා ඔබට උදවු කරන්නම්.
C - දේශකයා පැවසූ කරුණු .............................. විවිධ වාද විවාද ඇති විය.
D - දේශනය .............................. විද්වත් පිරිසක් සහභාගි වූහ.
ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E - පිළිබඳ F - නොහොත් G - සඳහා H - නැවත
(1) E, F, G, H (2) E, G, H, F (3) H, F, E, G (4) F, H, E, G

**32.** පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මම ගෙදර එන විට යාළුවන් මූණ ගැහුණා."
(1) මා ගෙදර එද්දී මිතුරන් මුණ ගැසුණෙමි. (2) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ.
(3) මා ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ. (4) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණෙමි.

**33.** විලියම් ශේක්ස්පියර් විසින් රචනා කරන ලද නාට්‍යයක් **නො වන්නේ**,
(1) ඔතෙලෝ ය. (2) හැම්ලට් ය.
(3) ද කොකේසියන් චෝක් සර්කල් ය. (4) ඇන්තනි ඇන්ඩ් ක්ලියෝපැට්රා ය.

**34.** උපමාවක් සහිත කවි පදය තෝරන්න.
(1) සිසිවන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින (2) ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙවඟන
(3) විදෙන ලෙළෙන නරුබර පුළුලුකුළ රැඳී (4) සැළලිහිණිය වඩු කැලණිය පුරවරට

**35.** 'එක් තිඹිරි රුකකට නැඟී නොවිළික්සුණු එල අනුභව කරනුයේ' යන පාඨයෙහි නොවිළික්සුණු යන වචනයේ අදහස කුමක් ද?
(1) ඉදී නැති (2) නොපිපිරුණු (3) කැමට නුසුදුසු (4) රසවත් නැති

**36.** පහත සඳහන් ගී ඛණ්ඩයේ හතරවැනි පදය තෝරන්න.
"බලි තරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ලද ලංකා
පුලතිසි දැම් සිරි රහල් කුමරතුගු පඬුවන් ලද ලංකා
විදු සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද ලංකා
................................................................"

(1) සමනොළ කිරිගල් පිදුරුතලා ඈ කෙහෙ ගැට බැඳි ලංකා
(2) මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා
(3) තේ වතු පොල් වතු කෙත් වතු පෙළ උකුළේ නළවන ලංකා
(4) ඔබ රැකුණොත් ලෝකුඹුව ද අපහට සීත ගඟුලී ලංකා

**37.** "මගේ මිත්‍ර ඉලෝ සුබොලාඩිසේ, මොක ද අපි මේ කාරණාව එළි කළා ම ඇති වැරැද්ද? අබ්ෂ්විල්ලි වතුපිටිවලට අයිතියක් නැද්ද ඔය කොලු පැටියට වගේ ම මේ මනුස්සයට?" යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?

(1) තල මල පිපිලා
(2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු
(4) කිරිමුට්ටිය ගඟේ ගියා

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහරේ දී අලියන් වේලාව යනු,

(1) අලි ගමන් කරන වේලාවයි.
(2) රාත්‍රි කාලයයි.
(3) අඳුර වැටෙන වේලාවයි.
(4) උදෑසන කාලයයි.

**39.** පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වර සුර පුරෙහිවත් නො වසති නිරය ලෙද
ගොරතර නිරෙහි වත් පරනට වැඩ ඇති ද
සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ

(1) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් මිනිසුන් නරක වැඩ නොකරතත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. අන්‍යයන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකය සේ සලකා දුෂ්කර ලෙස අපායේ වුව ද වාසයට කැමතිය.

(2) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් ජනයා අනෙක් අයට යහපතක් නොවේ නම් උතුම් දිව්‍ය ලෝකය වුවත් අපාය සේ සලකා එහි වාසය නොකරති. එහෙත් අනුන්ට යහපතක් කළ හැකි නම් අතිශය ඝෝර වූ අපායෙහි වුවත් දිව්‍ය ලෝකය සේ සලකා හැසිරෙති.

(3) ස්ථිරසාරවූ ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකළත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. එහෙත් ඝෝර වූ අපායෙහි වුව ද අනුන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකයෙහි මෙන් සලකා වාසය කරති.

(4) ස්ථිරසාර ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකරන අතර දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. ඝෝරවූ විශාල අපායෙහි වුවත් නරක වැඩ නැති නම් එහි දිව්‍ය ලෝකය සේ සලකා නිරන්තරයෙන් හැසිරෙති.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

"සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලිත්වය හෙළිවන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇතිවන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය."

(1) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීම පාඨකයාට වින්දනයක් ඇති වන පරිදි ඉදිරිපත් කිරීමෙන් ඔහුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.

(2) සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලිත්වය මතුවන්නේ තමන් තෝරා ගන්නා අරුත්බර අත්දැකීම වින්දනීය ලෙස ඉදිරිපත් කිරීම නිසා ය.

(3) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීමක් වින්දනීය ලෙසින් නැවත ඉදිරිපත් කර ඇති ආකාරයෙන් ඔහුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.

(4) අරුත්බර අත්දැකීමක් තෝරාගෙන එය වින්දනීය ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි නම් එමගින් සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලිත්වය හෙළි වේ.


* *

### 2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය


| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | ...2.... | 21. | ...4.... |
| 02. | ..1.... | 22. | ...3.... |
| 03. | ...3.... | 23. | ...3.... |
| 04. | ...3.... | 24. | ...2.... |
| 05. | ...2.... | 25. | ...4.... |
| 06. | ...1.... | 26. | ...1.... |
| 07. | ...3.... | 27. | ...2.... |
| 08. | ..1... | 28. | ...4.... |
| 09. | ...2.... | 29. | ...4.... |
| 10. | ...4.... | 30. | ...4.... |
| 11. | ...1.... | 31. | ...4... |
| 12. | ...3.... | 32. | ...3.... |
| 13. | ...2.... | 33. | ...3.... |
| 14. | ...1.... | 34. | ...1.... |
| 15. | ...4.... | 35. | ...1.... |
| 16. | ...2.... | 36. | ...4.... |
| 17. | ...4.... | 37. | ...2.... |
| 18. | ...4.... | 38. | ...3.... |
| 19. | ...1.... | 39. | ...2.... |
| 20. | ...4.... | 40. | ...1.... |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

## 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)




| තේමාව | පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව | පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව |
|---|---|---|
| භාෂා කුසලතා | 1 (95%) | 20 (31%) |
| ව්‍යාකරණ | 9 (90%) | 8 (19%) |
| භාෂා සාහිත්‍යය | 36 (71%) | 34 (40%) |
| විශ්ලේෂණය හා අවබෝධය | 25 (84%) | 40 (23%) |




I ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී පදනම් කරගනු ලැබූ තේමා හතර අතුරෙන්, එක් එක් තේමාවට අයත් ප්‍රශ්නවල පහසුතා සලකා, එම එක් එක් තේමාවෙහි මධ්‍යක පහසුතාව මෙම ප්‍රස්තාරයෙහි නිරූපණය කර ඇත.

ඒ අනුව එම තේමා අතුරෙන් පහසුතාව වැඩි ම ප්‍රශ්නය භාෂා කුසලතාව තේමාව යටතේ ඇතුළත් 1 වන ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 95% කි. පහසුතාව අඩු ම ප්‍රශ්නය වන්නේ ව්‍යාකරණ යටතේ ඇති 8 ප්‍රශ්නයයි. එහි පහසුතාව 19% කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි මධ්‍යක පහසුතාව 55%කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) (සිංහල)

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | ප්‍රතිචාර නොදැක්වූ |
| 1 | 2 | 2.2% | **95.4%** | 0.9% | **1.4%** | 0.1% |
| 2 | 1 | **93.9%** | **2.2%** | 0.9% | 2.9% | 0.1% |
| 3 | 3 | 9.3% | 4.3% | **79.5%** | 6.8% | 0.1% |
| 4 | 3 | **1.5%** | 18.1% | **70.9%** | 9.5% | - |
| 5 | 2 | 6.1% | **76.1%** | 7.3% | 10.2% | 0.3% |
| 6 | 1 | **77.7%** | 15.6% | 4.2% | 2.4% | 0.1% |
| 7 | 3 | 27.9% | 15.6% | **42.8%** | **13.3%** | 0.4% |
| 8 | 1 | **19.3%** | **38.3%** | 16.3% | 25.8% | 0.3% |
| 9 | 2 | 5.1% | **89.7%** | 2.5% | 2.5% | 0.2% |
| 10 | 4 | 16.4% | 12.8% | 23.6% | **46.6%** | 0.6% |
| 11 | 1 | **37.1%** | **12.1%** | 27.3% | 23.1% | 0.4% |
| 12 | 3 | 2.8% | 5.9% | **84.4%** | **6.6%** | 0.3% |
| 13 | 2 | **12.8%** | **57.2%** | 21.3% | 8.4% | 0.3% |
| 14 | 1 | **76.2%** | 7.9% | **5.2%** | 10.7% | - |
| 15 | 4 | **16.8%** | 14.6% | 7.2% | **61.2%** | **0.2**% |
| 16 | 2 | 6.8% | **72.1%** | 8.5% | 12.4% | 0.2% |
| 17 | 4 | **10.4%** | 42.9% | 19.0% | **27.4%** | **0.3**% |
| 18 | 4 | 3.7% | 7.3% | **7.1%** | **81.9%** | **-** |
| 19 | 1 | **47.2%** | **25.7%** | 11.9% | 14.9% | 0.3% |
| 20 | 4 | 32.9% | 22.0% | 13.9% | **30.6%** | **0.6**% |
| 21 | 4 | 10.6% | **10.2%** | 22.9% | **56.0%** | **0.3**% |
| 22 | 3 | 17.9% | 18.9% | **43.3%** | **19.5%** | 0.4% |
| 23 | 3 | **20.6%** | 17.5% | **44.7%** | 16.8% | 0.4% |
| 24 | 2 | 22.6% | **36.4%** | 19.5% | **21.2%** | 0.3% |
| 25 | 4 | **5.4%** | 5.2% | 5.1% | **84.0%** | **0.3**% |
| 26 | 1 | **93.3%** | **2.1%** | 3.2% | 1.4% | - |
| 27 | 2 | 7.7% | **75.2%** | **9.7%** | 7.1% | 0.3% |
| 28 | 4 | 12.7% | 16.3% | 25.5% | **45.1%** | 0.4% |
| 29 | 4 | **15.4%** | 21.3% | 30.1% | **33.2%** | **-** |
| 30 | 4 | 25.9% | **8.5%** | 17.3% | **47.9%** | **0.4**% |
| 31 | 4 | 2.7% | **3.5%** | 7% | **86.7%** | 0.1% |
| 32 | 3 | 14.2% | 11.8% | **41.5%** | 32.3% | 0.2% |
| 33 | 3 | **23.6%** | 19.6% | **36.3%** | 20.1% | 0.4% |
| 34 | 1 | **39.7%** | 18.7% | 18.7% | 22.6% | 0.3% |
| 35 | 1 | **69.2%** | **8.3%** | 16.3% | 6.2% | - |
| 36 | 4 | 14.2% | 9.3% | **5.1%** | **70.9%** | **0.5**% |
| 37 | 2 | 28.0% | **57.4%** | 6.4% | 7.7% | 0.5% |
| 38 | 3 | 16.3% | 12.1% | **58.5%** | 12.9% | 0.2% |
| 39 | 2 | 13.2% | **37.2%** | **26.9%** | 22.3% | 0.4% |
| 40 | 1 | **22.7%** | 24.0% | 30.2% | 22.7% | 0.4% |

සටහන : එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය කළු පැහැයෙන් දක්වා ඇත.

### 2.1.6 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳ ව අයදුම්කරුවන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිතය.

මෙම බහුවරණ ප්‍රශ්න හතළිහට ම ඒ සඳහා විශේෂයෙන් සැකසුණු ආකෘතියක පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍ර දෙකට ම හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I පත්‍රයේ ප්‍රශ්න හතළිහට පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත්, සාමාන්‍යයෙන් පැය එකක කාලයක් ඒ සඳහා යෙදවීම ප්‍රමාණවත් යැයි අපේක්ෂා කෙරේ.

අංක 8 පිටුවෙහි ප්‍රස්තාරයේ දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 40 අතුරෙන් අංක 1, 2, 3, 5, 6, 9, 12, 14, 18, 25, 26, 27, 31 යන ප්‍රශ්නවල පහසුතාව 75% ඉක්මවා ඇත. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් 75%ට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබිණි. එබැවින් එකී ප්‍රශ්න පහසුතම ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. එම ප්‍රශ්න අතුරෙන් අංක 1 ප්‍රශ්නය වඩාත් ම පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 95%ක් වී ඇත.

අංක 4, 13, 15, 16, 21, 35, 36, 37, 38 යන ප්‍රශ්නවල පහසුතා 50% - 75% අතර ප්‍රාන්තරයට අයත් වී ඇත. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සිසුනට පහසු වී ඇති බව අනාවරණය වේ.

අංක 7, 10, 11, 19, 20, 22, 23, 24, 28, 29, 30, 32, 33, 34, 39 යන ප්‍රශ්නවල පහසුතා 30% - 50% ත් අතර ප්‍රාන්තරයට අයත් වේ.

ප්‍රශ්න අංක 8, 17, 40 යන ප්‍රශ්නවල පහසුතා 30%ට වඩා අඩු වන බැවින් එම ප්‍රශ්න බොහෝ අයදුම්කරුවන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. එයින් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ 8 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 19%ක් වී ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න හතළිහ පහත සඳහන් පරිදි ප්‍රධාන තේමා හතරක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

1. භාෂා කුසලතා - 1, 2, 3, 4, 5, 6, 14, 15, 16, 19, 20, 21, 26, 27, 28, 35, 38
2. ව්‍යාකරණ - 7, 8, 9, 10, 11, 12, 13, 17, 18, 22, 23, 24, 29, 30, 31, 32
3. භාෂා සාහිත්‍යය - 34, 36, 37
4. විශ්ලේෂණය හා අවබෝධය - 25, 33, 39, 40

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් ප්‍රශ්න 17ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාවෙනි. I පත්‍රයට හිමි ලකුණුවලින් 43%ක් මේ සඳහා වෙන් කෙරෙන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න හතළිහ අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 1 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 95% කි.

භාෂා කුසලතා තේමාවට අයත් අංක 1, 2, 26 යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 95%, 94%, 93% වේ. I පත්‍රයේ ප්‍රශ්න හතළිහ අතුරෙන් ඉහළ ම පහසුතාව ලබාගෙන ඇත්තේ ද භාෂා කුසලතා තේමාවට අයත් මෙම ප්‍රශ්න තුනයි. ඒ සෑම ප්‍රශ්නයක ම පහසුතාව 92% ඉක්මවා ඇත.

මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර ප්‍රශ්න බවට පත්ව ඇත්තේ අංක 19, 20, 28 යන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 47%, 31%, 45% වේ.

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 20 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් සිවුවන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 31%ක් පමණි. අයදුම්කරුවන්ගෙන් 33%ක් පළමු වරණය ද 22%ක් දෙවන වරණය ද 14% ක් තුන්වන වරණය ද පිළිතුරු ලෙස තෝරා ඇත.

මෙහි අංක 20 ප්‍රශ්නය යටතේ ඉරබටු තරුව හැඳින්වීම සඳහා නො යෙදෙන වරණය තෝරා ගැනීම අපේක්ෂිත වුව ද දී ඇති පද පිළිබඳ ව නිවැරදි අවබෝධයක් සිසුන් තුළ නොමැති බව පෙනී යයි. එයට හේතුව වන්නේ පෙළපොත නිවැරදි ව පරිහරණය නොකිරීම යි.

අනතුරුව අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කරන්නේ අංක 28 ප්‍රශ්නය යි. ඒ සඳහා නිවැරදි පිළිතුර වන්නේ සිවු වන වරණය වන නමුදු නිවැරදි පිළිතුර සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 45%කි. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර තේරීමට අපහසු වී ඇත්තේ පෙළපොත් පරිශීලනය නොකිරීම හා බාහිර පොතපත පරිශීලනය නොකිරීම නිසා විය යුතු ය. භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී නිවැරදි ව භාෂාව භාවිත කරමින් ලියන ලද පොත්පත් සඟරා ආදි ලේඛන සැලකිල්ලෙන් පරිහරණය කරමින් තම වාක් කෝෂය දියුණු කර ගැනීමට ගුරු සිසු දෙපාර්ශවය ම යොමු විය යුතු ය.

මෙම ප්‍රශ්න 17හි ම පහසුතා සලකා මධ්‍යක පහසුතාව (Average Facility) ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත පහසුතාව 69%කි.

**ව්‍යාකරණ**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි ව්‍යාකරණ තේමාව යටතේ බහුවරණ ප්‍රශ්න 16ක් අඩංගු වූ අතර, මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 40%ක් එම තේමාවට වෙන් වී තිබුණි.

ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න 16 අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ 9 වැනි ප්‍රශ්නයට යි. එහි පහසුතාව 90%කි. මෙම තේමාව යටතේ ඇති පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි ප්‍රශ්න අංක 12, 18, 31 යන ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 84%, 82%, 87% වේ.

ව්‍යාකරණ තේමාව යටතේ අයදුම්කරුවන්ට දුෂ්කර ම ප්‍රශ්නය වී ඇත්තේ 8 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 19%ක් පමණි. මෙම ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුර අයත් වන්නේ පළමු වන වරණයට වුවත් එය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 19%ක් පමණක් වන අතර, අයදුම්කරුවන්ගෙන් 38%ක් දෙවන වරණය ද, 16%ක් තෙවන වරණය ද, 26%ක් සිව්වන වරණය ද තෝරා ඇත.

සරල වියරණ රීති වන අක්ෂර වින්‍යාසය පිළිබඳ ව අයදුම්කරුවන් තුළ ඇති අනවබෝධය මෙහිදී කැපී පෙනෙයි.

17 වන ප්‍රශ්නය භාෂාවේ පද වර්ග පිළිබඳ ව අයදුම්කරුවන්ගේ දැනුම මනින ප්‍රශ්නයක් වන අතර එහි නිවැරදි පිළිතුර ඇතුළත් සිවු වන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 27%ක් පමණි. භාෂාවේ පද වර්ග පිළිබඳ ව ප්‍රමාණවත් අවබෝධයක් ඇති කිරීමට පන්ති කාමරය තුළ ගුරු සිසු අවධානය වැඩි කළ යුතු ය.

එමෙන්ම ප්‍රශ්න අංක 24, 29 ප්‍රශ්න ද අයදුම්කරුවන්ට දුෂ්කර වී ඇති බව සැලකිය හැකි ය. ඒවායේ පහසුතා පිළිවෙළින් 36% හා 33% වේ.

ප්‍රශ්න අංක 7, 10, 22, 23, 30, 32 යන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සැපයීමේදී ඒවායේ පහසුතාව 42% - 48% අතර වේ. සමස්තයක් ලෙස ව්‍යාකරණ තේමාවට අයත් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා ගැනීමේ මධ්‍යයක පහසුතාව (Average Facility) 51%කි.

**භාෂා සාහිත්‍යය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ භාෂා සාහිත්‍යය තේමාව ඇසුරෙන් සකස් වී ඇත්තේ ප්‍රශ්න තුනක් පමණි. එනම් අංක 34, 36, 37 යන ප්‍රශ්න වේ. මෙම ප්‍රශ්න තුන අතුරෙන් ඉහළ ම පහසුතාව ලබා ඇත්තේ 36 වන ප්‍රශ්නයයි. එහි පහසුතාව 71%කි. ප්‍රශ්න අංක 34 හා 37 සඳහා පහසුතාව පිළිවෙළින් 40% හා 57% වේ.

මෙම තේමාවට අදාළ ප්‍රශ්න තුන ම පෙළපොත ඇසුරෙන් සකස් කර ඇති නමුත් පහසුතාව මෙවන් ප්‍රමාණයක තිබීමට හේතුව පෙළපොත නිසි පරිදි පරිහරණය නොකිරීම යි.

මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 7%ක් මෙම තේමාවට වෙන් වී තිබුණි. භාෂා සාහිත්‍ය තේමාවට අදාළ ප්‍රශ්න තුනෙහි මධ්‍යක පහසුතාව (Average Facility) 56%කි.

**විශ්ලේෂණය හා අවබෝධය**

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 25, 33, 39, 40 යන ප්‍රශ්න හතර අඩංගු වී තිබුණි. I පත්‍රයට හිමි ලකුණුවලින් මෙම තේමාව සඳහා 10%ක බර තැබීමක් සිදුකර ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් වැඩිම පහසුතාව 25 වන ප්‍රශ්නයට හිමි වී ඇති අතර එහි පහසුතාව 84%කි. ප්‍රථම වරට නව මුහුණුවරකින් ඉදිරිපත් කළ මෙම ප්‍රශ්නයට ඉහළ පහසුතාවක් ලබාගැනීම විශේෂත්වයකි.

මෙම තේමාව යටතේ ඇති දුෂ්කර ම ප්‍රශ්නය ලෙස ප්‍රශ්න අංක 40 සැලකිය හැකි ය. එහි පහසුතා 23%කි. ප්‍රශ්න අංක 33 හා 39 සඳහා පහසුතාව පිළිවෙළින් 36% හා 37% වේ. ප්‍රශ්න අංක 39 සහ 40 යන ප්‍රශ්න දෙක ඍජුව ම විශ්ලේෂණ ගණයට අයත් වන අතර ඒවායේ පහසුතාව දෙස බැලීමේදී පෙනී යන්නේ විශ්ලේෂණ හැකියාව පිළිබඳ ව අයදුම්කරුවන්ට මනා අවබෝධයක් නොමැති බව යි.

ප්‍රශ්න අංක 33 ඍජුව ම පෙළපොත ඇසුරෙන් සකස් කර ඇති අතර මේ සඳහා 36%ක පහසුතාව ලබා ගැනීමෙන් පෙනී යන්නේ පෙළපොත නිසි පරිදි පරිශීලනය නොකිරීමේ දුර්වලතාව යි.

විශ්ලේෂණ හා අවබෝධය තේමාවට අයත් ප්‍රශ්න හතරෙහි ම පහසුතා සලකා මධ්‍යක පහසුතාව (Average Facility) ගණනය කළ විට එය 45%කි.

| තේමාව | තේමාවට ඇතුළත් වී ඇති ප්‍රශ්න සංඛ්‍යාව | බර තැබීම | තේමාවේ පහසුතාව |
|---|---|---|---|
| 1) භාෂා කුසලතා | 17 | 43% | 69% |
| 2) ව්‍යාකරණ | 16 | 40% | 51% |
| 3) භාෂා සාහිත්‍යය | 03 | 7% | 56% |
| 4) විශ්ලේෂණය හා අවබෝධය | 04 | 10% | 45% |

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 55%කි. එනම් මෙම පත්‍රයට පෙනී සිටි අයදුම්කරුවන් සමස්තයක් වශයෙන් ගත් කල, ඔවුන් උපයා ගෙන ඇත්තේ එම පත්‍රයට උපයා ගත හැකිව තිබූ උපරිම ලකුණුවලින් 55%ක් පමණි. මෙයින් පෙනී යන්නේ මෙම පත්‍රයට ලකුණු ලබා ගැනීම මධ්‍යස්ථ මට්ටමක පැවති බව යි.

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයේ ප්‍රශ්න අංක 8, 11, 17, 20, 24, 29, 33, 34, 39, 40 යන ප්‍රශ්න දහය සඳහා ලබා ඇති පහසුතාව 40% හෝ ඊට අඩු මට්ටමක පවතී. එම ප්‍රශ්න සංඛ්‍යාව මුළු ප්‍රශ්න ගණනින් 25% කි. මුළු ප්‍රශ්න ගණනින් 25%ක් වූ ප්‍රශ්න ගණනක් සඳහා 40%ට අඩු පහසුතාවක් ලබා තිබීම සෑහීමකට පත්විය නොහැකි කරුණකි.

ඉහත ප්‍රශ්න දහයෙන් ප්‍රශ්න අංක 8, 11, 17, 24, 29 යන ප්‍රශ්න පහ ම ව්‍යාකරණ තේමාවට අයත් වූ ඒවා ය. මෙයින් ගම්‍ය වන්නේ අඩු පහසුතාවක් ලබා ඇති ප්‍රශ්න දහය අතුරෙන් 50%ක්ම ව්‍යාකරණ තේමාවට අදාළ ව සකස් කර තිබුණ බව යි. එයින් ප්‍රකට වන කරුණ වන්නේ අයදුම්කරුවන් ව්‍යාකරණ දැනුම සම්බන්ධයෙන් දක්වන කුසලතාව අඩු බව යි.

මෙම ප්‍රශ්න දහය ඇතුළත විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතට ගැනෙන ප්‍රශ්න තුනක් ඇත. එය ප්‍රතිශතයක් ලෙස අඩු පහසුතාව ලැබූ ප්‍රශ්න දහය අතුරෙන් 30%ක ප්‍රමාණයකි.

විශ්ලේෂණය හා අවබෝධය තේමාවට අදාළ ව සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න හතරක් අඩංගු වී ඇති අතර ඉන් තුනක් ම අයත් වන්නේ අඩු පහසුතා ලැබූ ප්‍රශ්න දහය අතරට ය. එම තේමාවට අදාළ ප්‍රශ්න ගණනින් එය 75%කි. එනිසා විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ ව සිසුන් තුළ ඇති දැනුම අව ම බව පැහැදිලි වේ.

මෙම කරුණු සලකා බැලීමේදී ව්‍යාකරණ තේමාවට හා විශ්ලේෂණ හා අවබෝධය තේමාවට අදාළ ව පෙළපොත හා බාහිර පොත පත ඇසුරු කර ගනිමින් නිරන්තර අභ්‍යාසවල යෙදවීම වඩාත් සුදුසු බව කිව හැකි ය.

සමස්තයක් වශයෙන් පළමු ප්‍රශ්න පත්‍රයට අයත් සියලු ම ප්‍රශ්න පෙළපොත් ඇසුරින් සකස් කර තිබීම ගත හැකි ය. එසේ වුවත් සමස්ත පහසුතාව 55%ක් වීම සෑහීමට පත්විය නොහැකි තත්ත්වයකි.

නැවතත් අවධාරණය කළ යුතු විශේෂ කරුණු වන්නේ ශිෂ්‍යයා මෙන් ම ගුරුවරයා ද පෙළපොත් පරිශීලනය පිළිබඳ ව දැඩි අවධානය යොමු කළයුතු බව යි.

## 2.2 II ප්‍රශ්න පත්‍රය

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය හා පිළිතුරු සැපයීම පිළිතුරු තොරතුරු


මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

| | | |
|---|---|---|
| 1. ප්‍රශ්නය | : | භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10කින් සමන්විත වේ.<br>එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි. |
| 2. ප්‍රශ්නය | : | නිර්දිෂ්ට ව්‍යූහගත තේමා හතරක් අතුරෙන් එකක් තෝරා ගෙන, දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යූහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනා ගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.<br>ලකුණු 25 කි. |
| 3. ප්‍රශ්නය | : | දෙන ලද පාඨයක සාරාංශය, දෙන ලද වචන සීමාවක් තුළ ලිවිය යුතු වේ. භාෂාමය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.<br>ලකුණු 10 කි. |
| 4. ප්‍රශ්නය | : | දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු වේ. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.<br>ලකුණු 10 කි. |
| 5. ප්‍රශ්නය | : | දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදළ තොරතුරු අඩංගු අත් පත්‍රිකාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.<br>ලකුණු 15 කි. |

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

## 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩු ම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 99% හා 92% (ප්‍රස්තාරය 2, පිටුව 9) වේ. අයදුම්කරුවන්ගෙන් වැඩි ම ප්‍රතිශතයක් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩි ම පහසුතාවක් ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. දී ඇති ඡේදයක් පදනම් කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීම මගින් සිසුන්ගේ අවබෝධය පිළිබඳ හැකියාව මැනීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී ඇත. එහි පහසුතාව 67%ක් පමණ වීම මගින් නිගමනය කළ හැක්කේ එම ප්‍රශ්නය අනෙකුත් ප්‍රශ්නවලට වඩා මඳක් පහසු වී ඇති බවය.

එසේ ම මෙම පත්‍රයේ ප්‍රශ්න පහ අතුරෙන් 2 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%කට ආසන්න ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 49%කි. තිබූ රචනා ව්‍යූහ හතරෙන් එකක් ආශ්‍රයෙන් පමණක් රචනාවක් නිර්මාණය කිරීම සඳහා යොමු කෙරුණු මෙම ප්‍රශ්නය තුළ තම අභිමතය අනුව රචනා ව්‍යූහයක් තෝරා ගැනීමේ අවස්ථාවක් ද අයදුම්කරුවන්ට හිමිව තිබිණි. එසේම පූර්ව සූදානම මගින් වඩාත් සාර්ථක පිළිතුරක් නිර්මාණය කිරීමේ ඉඩ ප්‍රස්තා ද පැවතිණි. මෙම විෂයය යටතේ ප්‍රශ්න පත්‍ර තුනෙහි ම අඩංගු වන සියලු ම ප්‍රශ්න අතුරෙන් වැඩි ම ලකුණු ප්‍රමාණයක් වෙන් කෙරෙන ප්‍රශ්නය ද මෙය යි. මෙවැනි වාසිදායක තත්ත්ව රැසක් ම තිබියදීත් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා සාපේක්ෂ වශයෙන් අඩුවෙන් ලකුණු ලබා තිබීම විශේෂ අවධානයට යොමු විය යුතු වේ.

## 01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යුහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.
**(අ)** පතල **(ආ)** පතළ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
"කසල කළමනාකරණය පිළිබඳ පවතින ගැටලු නිරාකරනය කිරීම කාලීන අවශ්‍යතාවක් බව පරිසරවේදීහු පෙන්වා දෙති."

(iii) පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.
**(අ)** උදර + ආබාධ **(ආ)** ඉන් + ඉක්බිති

(iv) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.
"පරිසර සංරක්ෂණය පිළිබඳව උපසභාපතිතුමා පැවැත්වූ කතාවට සියල්ලෝ ම කොන්දේසි විරහිතව එකඟතාව දැක්වූහ."

(v) පහත සඳහන් පද්‍ය පාඨයේ **තද කළු** අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.
"අසන **රිසින්** නයි කැල **ඔසලෝ යා**"

(vi) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
**(අ)** බස්නාහිර සහ උතුර අතර ඇති අනුදිශාව
**(ආ)** දුරදිග බලා ක්‍රියා කරන

(vii) පහත දැක්වෙන යෙදුම් සඳහා හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
**(අ)** පාවහන් **(ආ)** අලියා

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම්, ඒවා නිදොස් කර නැවත ලියන්න.
**(අ)** ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරති.
**(ආ)** ක්‍රීඩකයෝ තරගය දිනති'යි පුහුණුකරුවෝ සිතූහ.

(ix) පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල **තද කළු** අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
**(අ)** රියදුරා මාර්ග නීති **කඩකරමින්** රිය පැදවූයේ ය.
**(ආ)** සියලු දෙනා ම විභාගයෙන් **සමත් වෙත්වා**'යි කියමින් ගුරුතුමිය සමුගත්තා ය.

(x) පහත සඳහන් **(අ)** සහ **(ආ)** යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.
**(අ)** විශේෂ දෙසුම **(ආ)** කර්තෘ වැකි (ලකුණු 2 × 10 = 20 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1\. (i) (අ) පතල - ආකරය (භූගත ඛනිජ වර්ග ලැබෙන)
(ආ) පතළ - පැතුරුණු, ප්‍රසිද්ධ, ව්‍යාප්ත, ප්‍රකට
නිවැරදි අක්ෂර වින්‍යාසය හා උක්ත අඛ්‍යාත සම්බන්ධය සහිත අර්ථවත් වාක්‍ය ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ii) කසළ
නිරාකරණය

(iii) (අ) උදරාබාධ - පූර්ව ස්වර ලෝප සන්ධිය/ස්වර දීර්ඝය
(ආ) ඉනික්බිති - ස්වර සන්ධිය/ආරෝහණ සන්ධිය

(iv) සංරක්ෂණය - සං
පිළිබඳව - පිළි
උපසභාපතිතුමා - උප
විරහිතව - වි
පරිසර - පරි
උපසර්ගය පමණක් ලියා තිබීම ද ප්‍රමාණවත්ය. උපසර්ගය සහිත පදය ලියා තිබුණත් ලකුණු දෙන්න.

(v) රිසින් - කැමැත්තෙන් / ආශාවෙන් / රිස්සෙන් / රුචියෙන් / බලාපොරොත්තුවෙන් / අදහසින් / අපේක්ෂාවෙන් / ඊප්සාවෙන් / අභිලාෂයෙන් / වුවමනාවෙන්
ඔසලෝයා - රැස්වූහ / එක්වූහ / පැමිණියහ / රොක්වූහ

(vi) (අ) වයඹ
(ආ) දූරදර්ශී / දුර දක්නා


(vii) (අ) වාං පතුල් / වාංහම් / වාංහං / කඩපතුල්
(ආ) මහ එකා / මහ ඇත්තො / ලොකු ඇත්තො / අලි බොටා

(viii) (අ) ඕ තොමෝ පන්සලට ගොස් මල් පහන් පූජා කරයි / කරන්නීය. / ඌ තුමූ ............ කරති.
(ආ) ක්‍රීඩකයන් තරගය දිනතියි පුහුණුකරුවෝ සිතූහ / සිතුවෝය.
ක්‍රීඩකයින් තරගය දිනතියි පුහුණුකරුවෝ සිතූහ / සිතුවෝය.

(ix) (අ) මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය / කෘදන්ත ක්‍රියා / ක්‍රියා නිපාත / නෛපාතික ක්‍රියා
(ආ) ආශීර්වාද ක්‍රියා / ප්‍රාර්ථනා ක්‍රියා / ආසී කිරිය

(x) (අ) විශේෂ දේශනය / වෙසෙස් දෙසුම / විසෙස් දෙසුම
(ආ) කර්තෘ වාක්‍ය / කතු වැකිය


## 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99% ක් පමණ පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 20%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 20% වන අතර 19% ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.




සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනු කොටස් 17කින් සමන්විත වූ අතර වැඩි ම පහසුතාව ඇත්තේ IV වන කොටසට ය. එහි පහසුතාව 76%කි.

මෙම ප්‍රශ්නයෙන් මැනෙන්නේ අව්‍යය පද යටතේ ඉගැන්වෙන උපසර්ග පිළිබඳව යි. වාක්‍යයේ දී ඇති උපසර්ග සහිත පද තෝරා ගැනීමටත් ඒ අනුසාරයෙන් උපසර්ග උපුටා දැක්වීමටත් ශිෂ්‍යයන්ට පහසු වී ඇති නිසා ඊට ලැබුණු ප්‍රතිචාර ඉහළ මට්ටමක පැවති බව පෙනේ.

දෙවන වැඩි පහසුතාව වන 74% ලබාගෙන ඇත්තේ නව වන කොටසේ (ආ) අනුකොටස ය. ප්‍රාර්ථනා ක්‍රියා පිළිබඳව ප්‍රාථමික ශ්‍රේණිවල සිට ම අවධානය යොමු කෙරෙන බැවින් එම ප්‍රශ්නය පහසු වී ඇති බව පැහැදිලි වේ. එහෙත් එහි ම (අ) අනුකොටස යටතේ ද මිශ්‍ර ක්‍රියා මැනෙන අතර "කඩකරමින්" යන පදයේ ක්‍රියාවර්ගය නම් කිරීමේදී එය නිවැරදි ව නම් කිරීමට ඇතැම් අයදුම්කරුවන් අපොහොසත් වීම එම අනුකොටසට අඩු පහසුතාවක් පෙන්වීමට හේතුවක් ලෙස නිගමනය කළ හැකි ය.

තෙවන වැඩි පහසුතාව වන 73% ලබාගත් (vi) කොටස (අ) අනුකොටස තනිපද යෙදීම පිළිබඳ ව විමසන ප්‍රශ්නයකි. බස්නාහිර හා උතුර අතර ඇති අනු දිශාව හැඳින්වීමට යෙදෙන තනි පදය දැක්වීමට අයදුම්කරුවන්ගෙන් වැඩි පිරිසක් සමත් වී ඇත.

(i) (අ), (ii), (iii) (අ), (vi) (ආ), (ix) (අ), (x) (අ) සහ (ආ) යන කොටස්වල/අනුකොටස්වල පහසුතා 50%-65% ප්‍රාන්තරය අතර පවතින අතර, මෙම අනුකොටස් 17 අතුරෙන් දුෂ්කර ම ප්‍රශ්නය වී ඇත්තේ (v) කොටසයි. එහි පහසුතාව 22%කි. ඒ අනුව අංකිත පදවල අර්ථ විමසා බැලෙන මෙම කොටසට සාර්ථකව පිළිතුරු සැපයීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇති බව පෙනේ. අර්ථ දැක්වීම පිළිබඳ ව නිසි අවබෝධයක් නොමැති වීම මෙයට හේතුව ලෙස දැක්විය හැකි ය.

අනතුරුව වඩාත් දුෂ්කර වී ඇත්තේ (vii) කොටසේ (අ) අනුකොටසය. එහි පහසුතාව 28%කි. එහි ම (ආ) කොටසෙහි පහසුතාව 40%කි. එම කොටසේ අනුකොටස් දෙකෙන් ම මැනෙනුයේ පරිමිත භාෂා පිළිබඳ නිරවුල් අවබෝධය යි. මෙම අනුකොටස් දෙකෙහි ම පහසුතාව පහළ මට්ටමක පැවතීමට හේතුව අයදුම්කරුවන් පෙළපොත් පරිශීලනයේ දක්වන දුර්වලතාව බව අනාවරණය විය.

(iii) වැනි කොටසේ (ආ) අනුකොටස (viii) කොටසේ (අ) සහ (ආ) අනුකොටස් ව්‍යාකරණ දැනුම විමසන ප්‍රශ්න වන අතර ඒ සඳහා ලබාගෙන ඇති පහසුතාව පිළිවෙළින් 45%, 35% සහ 41% විය. (I) කොටසේ (ආ) අනුකොටස දී ඇති පද අරුත් පැහැදිලි වනසේ වාක්‍යවල යෙදීමේ කුසලතාව මැනෙන ප්‍රශ්නයක් වන අතර එහි පහසුතාව 44%කි.

ක්‍රියාවර්ග හා උක්ත අනුක්ත පද සම්බන්ධය වැනි සරල ව්‍යාකරණ පිළිබඳ දැනුම අයදුම්කරුවන් තුළ නොමැති බවත් ව්‍යවහාරික භාෂාවේ යෙදෙන විශේෂිත පද පිළිබඳ නිරවුල් අවබෝධයක් නොමැති බවත් මෙහිදී පැහැදිලි විය. භාෂා පරිචය යටතේ ලේඛන කුසලතාව, භාෂණ අවබෝධය හා විශ්ලේෂණය කිරීම, භාෂා භාවිතය, ග්‍රන්ථ පරිහරණය හා වාක්‍ය අවබෝධය යන කරුණු මැනීම මෙයින් අපේක්ෂා කළ ද අයදුම්කරුවන් තුළ ව්‍යාකරණ පිළිබඳ මූලික දැනුම හීනවීමත් අවබෝධය පිළිබඳ දුර්වලතාත් දක්නට ලැබිණි. මේ සඳහා ව්‍යාකරණ ග්‍රන්ථ පරිශීලනයටත් වියරණ දැනුම වැඩි දියුණු කර ගැනීමටත් පෙළපොත් හා අමතර ග්‍රන්ථ පරිශීලනයටත් අයදුම්කරුවන් උනන්දු කරවිය යුතු ය.

**02 ප්‍රශ්නය**

අපේක්ෂණය : සංශ්ලේෂණ හැකියාව මැන බැලෙන්නකි. දෙන ලද ව්‍යුහගත ඡේද හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහිදී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි. මාර්ගෝපදේශිත රචනා මූලධර්මය මෙහිදී අනුගමනය කර ඇත.

**2.** පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** මේ වන විට ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින විශාල ප්‍රමාණයේ ඉඩම් කැබලි කර විකිණීම මගින් ප්‍රබල සමාජ ප්‍රශ්න කිහිපයක් උද්ගත වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝගයක් වන පොල් වගාව විනාශ මුඛයට පත්වීම ඉන් එකකි. ළිඳක්, වැසිකිළියක් සහ විධිමත් පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානයක් වැනි අත්‍යවශ්‍ය මූලික අංගෝපාංග පවා ඉදිකර ගැනීමට ප්‍රමාණවත් නොවන සුළු ඉඩකඩක් සහිත මේ බිම්කට්ටිවල ජීවත් වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි බලපෑම් එල්ලවීම තවත් ප්‍රශ්නයකි.

**(ආ)** වසවිසෙන් තොර කෘෂිකර්මාන්තයක් මෙරට ස්ථාපනය කිරීම පිළිබඳව මේ දිනවල විවිධ යෝජනා ඉදිරිපත් වෙමින් පවතී. රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතය දැනටමත් ක්‍රියාත්මක ය. මෙම ක්‍රියාවලියට සමගාමීව රුක්රෝපණය වැනි ව්‍යාපෘති ද ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍ය වන්නේ කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීම උදෙසා මෙන් ම පරිසර සංරක්ෂණය උදෙසා ද එමගින් පිටුබලයක් සැපයෙන බැවිනි.

**(ඉ)** ළමා මනසට ගෝචර වන චිත්‍රපට නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ රටවල අවධානය යොමු වෙමින් පවතී. එහෙත් ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට නොමැති තරම් ය. අර්ථවත් තේමා සහිත ළමා චිත්‍රපට ළමයින්ට විනෝදාස්වාදන මාධ්‍යයක් වශයෙන් මෙන් ම විවිධ තොරතුරු සම්බන්ධයෙන් දැනුම ලබාදෙන මාධ්‍යයක් වශයෙන් ද භාවිත කිරීමේ හැකියාව පවතී.

**(ඊ)** සමුද්‍රීය පරිසර දූෂණය හෙවත් වෙරළාසන්න පරිසර දූෂණය අතින් ශ්‍රී ලංකාව පස්වන ස්ථානයේ පවතින බව පසුගියදා පුවත්පත් වාර්තාවක පළ වී තිබිණි. මෙරටට විදේශ විනිමය උපයා ගැනෙන ප්‍රධාන ක්‍රමවේදයක් වන සංචාරක ව්‍යාපාරය කෙරෙහි මෙන් ම විශේෂයෙන් ම වෙරළාසන්න ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ සෞඛ්‍යය කෙරෙහි ද ඍණාත්මක ව බලපාන සමුද්‍රීය පරිසර දූෂණය වළක්වා ගැනීමේ ක්‍රමෝපාය කෙරෙහි අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවකි. (ලකුණු 25 යි)

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ)
- ඉඩම් කැබලි කර විකිණීම නිසා මතු වන සමාජ ආර්ථික ගැටලු
- ඉඩම් කැබලි කර විකිණීමෙන් මතු වන ප්‍රශ්න
- ඉඩම් කැබලි කර විකිණීමෙන් මතු වන ආර්ථික පාරිසරික හා සමාජයීය ගැටලු

(ආ)
- වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් ස්ථාපනය කරමු
- පරිසර සංරක්ෂණයට නැඹුරු වූ කෘෂිකර්මාන්තයක් උදෙසා
- කාබනික පොහොර භාවිතයෙන් කෘෂිකර්මාන්තය නංවමු

(ඉ)
- ළමයින් සඳහා අර්ථවත් චිත්‍රපට නිෂ්පාදනය කරමු
- ළමා ලෝකය අර්ථවත් කරන්නට ළමා චිත්‍රපට මාධ්‍ය යොදා ගනිමු
- සංවර්ධනය කළ යුතු ශ්‍රී ලංකාවේ ළමා චිත්‍රපට කලාව

(ඊ)
- සමුද්‍රීය පරිසර දූෂණය වළක්වා ගනිමු
- සමුද්‍රීය පරිසර සංරක්ෂණයෙන් අපට ලැබෙන ප්‍රයෝජන
- සමුද්‍රීය පරිසරය සුරකිමු

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි රචනය හොඳින් කියවා ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය | - | ලකුණු 12 යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීපව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.


සැලකිය යුතුයි :

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.
03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
04. 1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර මුළු ලකුණු ගණන ලබාගන්න.


නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂ්‍යය : වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේදී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 51%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලෙසින් ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 12ට අඩුවෙන් ලබාගත් අයදුම්කරුවන් ප්‍රමාණය 24%කි. 19-25 අතර ලකුණු ලබාගත් ප්‍රමාණය 25%කි. සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතුණි.




මෙම ප්‍රශ්නයෙහි (අ), (ආ), (ඉ) සහ (ඊ) යටතේ පිළිවෙළින් ඉඩම් කැබලි කර විකිණීම නිසා මතුවන සමාජ, ආර්ථික හා පාරිසරික ගැටලු, පරිසර සංරක්ෂණයට නැඹුරු වූ කෘෂිකර්මාන්තය, ළමයින් සඳහා අර්ථවත් චිත්‍රපට නිෂ්පාදනය, සමුද්‍රීය පරිසර දූෂණය වැළැක්වීම යන මාතෘකා තේමා කරගනිමින් මාර්ගෝපදේශිත රචනා සඳහා විස්තරාත්මක ව්‍යුහගත ඡේද 4ක් ඉදිරිපත් කර තිබුණි.

එක් එක් රචනා මාතෘකා අනුව ඉඩම් කැබලි කර විකිණීම තේමා කරගත් රචනයේ පහසුතාව 40%ක් ද, පරිසර සංරක්ෂණය තේමා කරගත් රචනයේ පහසුතාව 53% ක් ද, ළමා චිත්‍රපට නිෂ්පාදය තේමා කරගත් රචනයේ පහසුතාව 47%ක් ද සමුද්‍රීය පරිසර දූෂණය තේමා කරගත් රචනයේ පහසුතාව 50%ක් ද විය.

සමස්තයක් ලෙස ගත් කල ප්‍රශ්නයෙහි මධ්‍යක පහසුතාව 48%ක් වන බැවින් රචනා ලිවීමේ නිපුණතාව අයදුම්කරුවන් තුළ තව තවත් වර්ධනය කළ යුතු බව පැහැදිලි ය. ස්වකීය අදහස් නිදහස් ව හා නිර්මාණාත්මක ව ජනනය කරවීමටත් ඒවා විධිමත් ව, සංවිධානාත්මක ව නිරවුල් ව හා ව්‍යාකරණානුකූල ව ඉදිරිපත් කිරීමටත් සිසුන් යොමු කළ යුතු ය.

රචනා මාතෘකාව හඳුනා ගැනීමට උපයෝගී කර ගැනීම සඳහා දී ඇති ඡේදයෙහි කරුණු ඉදිරිපත් කර ඇති රටාව සැලකිල්ලට ගැනීමෙන් රචනා සැකිල්ල යටතේ අයදුම්කරුවන්ගේ කරුණු සංවිධානය කර ගැනීමට පහසු වේ. වචන 250කට නො අඩු යන සීමාව 250-300 අතර ලෙස දැක්වීමෙන් අයදුම්කරුවන්ගේ නිදහස් ව ලිවීමේ හැකියාවට අවකාශයක් ලැබේ. අතිරේක වශයෙන් සම්භාව්‍ය ගද්‍ය පද්‍ය පොත පත කියවීම ද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පරිශීලනය කිරීම ද විශේෂයෙන්ම අන්තර්ජාලය ඇසුරෙන් නව ලෝකය පිළිබඳ ව රැස්කර ගත හැකි කරුණු ද සාර්ථක රචනා නිර්මාණය කිරීම සඳහා මහඟු අත්වැලක් කරගත හැකිය.

දී ඇති රචනා ව්‍යුහ අතරින් "අ" යටතේ ගෘහීත රචනා මාතෘකාව සඳහා අයදුම්කරුවන්ට මගපෙන්වීමක් ලෙස එම ව්‍යුහය පාදක කරගෙන විශ්ලේෂණාත්මක ව සැකිල්ලක් සාදා ගෙන, ඒ ඒ යටතේ කරුණු සංශ්ලේෂණය කර ගනිමින් ඉදිරිපත් කිරීම තුළින් වචන 250 සීමාවට පහසුවෙන් ළඟා වීමට හැකිවන ආකාරයට පහත ආදර්ශනය උපයෝගි කරගත හැකිය.

2. (ඉ) **ඉඩම් කැබලි කර විකිණීම නිසා මතුවන සමාජ ආර්ථික හා සෞඛ්‍ය ගැටලු**

මග දෙපස දක්නට ඇති සමහර දැන්වීම් පුවරු මගින් අපට වටහා දෙන්නේ ඉඩම් කැබලි කර විකිණීමේ වෙළෙඳ ව්‍යාපාරය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී යන බව යි.ව්‍යාපාරිකයාට වාසි අත් වුවත් එයින් ඇති වන සමාජ,ආර්ථික හා පාරිසරික ගැටලුවලට මුහුණ දිය යුතු වන්නේ එම ඉඩම් කැබලිවල ජීවත් වන මිනිසුන් පමණක් නො වේ. මුළු මහත් ජනතාව ම මේ ව්‍යාපාරය හේතු කොට ගෙන පීඩා විඳිති.

සරු ලෙස පොල් වගා කරන ලද අක්කර සිය ගණනින් යුක්ත විශාල ඉඩම් පර්චස් අට දහයේ කුඩා කැබලි බවට වෙන් කොට විකිණීමට ඇති බව දන්වන පුවරු මඟ දෙපස තිබෙනු නිරන්තරයෙන් ම දක්නට ලැබෙයි. පොල් වගා කෙරෙන ප්‍රදේශවල වතු හිමියෝ එයින් ම ආදායම් ලැබුවෝ වෙති.රටෙහි පරිභෝජනය සඳහා පොල් සපයන්නෝ ද ඔවුහු ය. මේ පොල්වතු කැබලි වී යාමෙන් පොල් වගාව විනාශ වීම නො වැළැක්විය හැකි වනුයේ එම ඉඩම් කැබලි මිල දී ගන්නවුන් තම නිවෙස් සාදා ගැනීම සඳහා පොල් ගස් සියල්ල උදුරා දැමීම නිසා ය.

ඉඩම් කැබලි වීමෙන් සිදු වන පොල් වගා විනාශය රටේ ආර්ථිකයට බලපායි. ප්‍රධාන අපනයන භෝගයක් වන පොල්වලින් රටට ලැබෙන ආදායම මේ වගා විනාශය නිසා අපට අහිමි වෙයි. එයින් ආර්ථික ගැටලු නිර්මාණය වෙයි. රටේ පොල් නිෂ්පාදනය අඩු වන විට පොල් මිල ඉහළ යයි. එයින් අපහසුතාවට පත් වන්නේ රටේ ජනතාව ය. මේ අනුව පැහැදිලි වන්නේ පොල් වගා කළ ඉඩම් කැබලි කර විකිණීම මගින් සිදු වන ආර්ථික ගැටලුව යි.

පර්චස් දහයක පමණ කුඩා ඉඩම් කැබැල්ලක ජීවත් වන මිනිසුන්ගේ සමාජ හා සෞඛ්‍යමය ගැටලු අප්‍රමාණ ය. ඔවුන්ට පාවිච්චි කිරීමට සිදුවන ඉඩකඩ සීමිත ය. පිරිසිදු ජලය ලබා ගැනීම සඳහා ළිඳක් තනා ගැනීමට ඔවුන්ට ඉඩක් නැත. නළ ජලයට ආවඩන්නට සිදු වන්නේ ඒ නිසා ය. නළ මගින් එන ජලය පිරිසිදු වුව ද අපිරිසිදු වුව ද ඒවා පානය කළ යුතු ය. නිවසේ කටයුතු සඳහා යොදා ගන්නා ජලය බැහැර කිරීමට නළ පද්ධතියක් හෝ කාණු පද්ධතියක් සැකසීමට ඉඩක් නැත. සෑම බිම් කැබැල්ලක ම නිවෙසකි. සෑම නිවසකින් ම බැහැර වන අපද්‍රව්‍යවලින් කාණු පිරී ඉතිරී යයි. දුගඳ දසත පැතිරෙයි. මැසි මදුරුවෝ බෝ වෙති. ඔවුහු විවිධ රෝග පතුරවති. සෑම නිවසක ම රෝගී දරුවෝ ය. කැබලි වූ ඉඩමක තැනුණු ගෙවල්වල තත්ත්වය එයයි. කැබලි වූ බිම්කට්ටිවල ජීවත් වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉතා ශෝචනීය වන්නේ එහෙයිනි.

එමෙන් ම තාප්ප අතර සිරවුණු ජීවිත ගෙවන ඔවුන්ට නිදහසේ හුස්ම ගැනීම පවා අසීරු ය. පිරිසිදු වාතාශ්‍රයක් නොලැබෙයි. නිවෙස්වලින් බැහැර කරන කසළ පිරුණු බඳුන් ගේ ඉදිරිපිට ය. ඒවායින් දුගඳ වහනය වෙයි. මේ සෑම කුඩා බිම් කැබැල්ලක ම වැසිකිළියක් ද වෙයි. වතුර රැඳීම නිසා වැසිකිළි වළවල් පිරී ඉතිරී යාමෙන් අවට පරිසරය දුර්ගන්ධයෙන් පිරෙයි. මෙබඳු පරිසරයක ජීවත් වන මිනිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිරිහීම නියත ලෙස ම සිදුවන්නකි. මේ අපවිත්‍රතාව නිසා ඩෙංගු, පාචනය, කොළරාව ආදී වසංගත රෝගත්, සමේ රෝගත් ඇති වෙයි. මේ නිවෙස්වල වැසියන් රෝගී වන්නේ කුඩා ඉඩම් කැබැල්ලක ජීවත් වීමේ දී අත්පත් වන අපහසුතා හා පීඩා නිසා ය.

මේ නිවාසවල ජීවත් වන මිනිසුන් අඩු ඉඩකඩක සුන්දරත්වය මවන්නට උත්සුක වන අවස්ථා බොහෝ ය. එමගින් ඉඩම් කැබලිවල ජීවත් වන්නවුන්ට යහපත් පරිසරයක් නිර්මාණය කරගත හැකි ය. ඒ මගින් ඔවුන්ගේ අපහසුතා හා පීඩා තරමක් දුරට හෝ මග හරවා ගත හැකි වනු ඇත. බඳුන් ගත එළවළු සහ මල් වගාව කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ආවරණ සහිත බඳුන්වලට කසළ රැස්කිරීම හා පරිසරය ඉතා පිරිසිදු ලෙස පවත්වා ගෙන යාම වැනි ක්‍රියාමාර්ග ගත හැකි ය.

මෙවැනි ක්‍රියාමාර්ගවලින් තරමක් දුරට තම අපහසුතාවලින් මිදුණා ද කුඩා ඉඩම් කැබලිවල තනාගත් නිවෙස්වල ජීවත් වන මිනිසුන්ට එතරම් මානසික නිදහසක් අත් නොවනු ඇත. එළිමහනට පැමිණ එහා මෙහා යමින් ගහ කොළ තුරු ලතාවල සෙවණ විඳිමින් පිරිසිදු වාතය ආශ්වාස කරමින් ගත කරන ජීවිතයක සුවය සතුට ඔවුන්ට නො ලැබේ. මානසික පීඩාව බොහෝ රෝගවල බීජය යි. කැබලි වූ කුඩා ඉඩම්වල ජීවත් වන්නවුන්ට ස්වභාවයෙන් ම අත් වන තත්ත්වය යි.

තවමත් ගම්බද ප්‍රදේශවල ඉඩම් කැබලි කිරීම හා විකිණීම නගරබද තරමට ම ව්‍යාප්ත වී නැත. එනිසා ම ගම්බද ජනතාව නිදහසේ සුව විඳිති. නාගරික පහසුකම් ගම තුළ ද ඇති කිරීමෙන් නගරය කරා ජනතාව ඇදී යාම වළක්වා ගත හැකි වනු ඇත. එවිට කුඩා බිම් කැබැල්ලකට කොටු වී නගරයේ ජීවත්වීමේ සිහිනය වෙත ළඟා වන්නට මිනිසුන් නො පෙලඹෙනු ඇත. එසේ නො වුව හොත් තව තවත් කුඩා කැබලිවලට ඉඩම් කැඩී යනු ඇත. එවිට අදටත් වඩා කුඩා ඉඩමක තැනුණු නිවෙස්වල ජීවත්වන්නට මිනිසුන්ට සිදු වනු ඇත. එවිට ඔවුන්ගේ සමාජ ආර්ථික හා සෞඛ්‍යමය තත්ත්වයට කුමක් සිදු වනු ඇති දැ'යි සිතීමට පවා දුෂ්කර වනු ඇත.

## 03 ප්‍රශ්නය

අපේක්ෂණය :

කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරෙන් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 - 65** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අද පවතින වෙළෙඳ ව්‍යාපාරවල එකම අරමුණ වී ඇත්තේ අධික ලෙස මුදල් ඉපයීමයි. මේ සඳහා වෙළෙන්දන් හැකි සෑම උපක්‍රමයක් ම යොදන අතර ඔවුන්ගේ අදහස් ක්‍රියාවට නංවන වෙළෙඳ දැන්වීම්කරුවෝ ද එය ඒ අයුරෙන් ම ක්‍රියාවට නඟති. තරගකාරී තත්ත්වයට පත්ව ඇති මෙම වාණිජමය අරමුණු සේවා හා භාණ්ඩ මගින් ක්‍රියාත්මක වේ. පාරිභෝගිකයා දිනා ගැනීම සඳහා අනුගමනය කරනු ලබන උපක්‍රම රටේ සංස්කෘතියට, සභ්‍යත්වයට හා අනාගත පැවැත්මට කොතරම් හිතකර ද යන්න ගැන තැකීමක් නොකිරීම කනගාටුවට කරුණකි. මෙම වෙළෙඳ උපක්‍රමවලට සාමාන්‍ය ජනතාව පමණක් නොව දැන උගත් අය පවා රැවටෙන අවස්ථා අපමණ ය.

අද විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා පමණක් නොව විවිධ රැස්වීම් මගින් ද තම භාණ්ඩ හෝ සේවාව සැමට ම වඩා වාසිදායක හා ලාභ බව පැවසීමට එහි නිරතවන කිසිවෙක් පසුබට නොවෙති. ඇත්ත නැත්ත වටහා ගැනීමට බැරි තරමට ප්‍රයෝගකාරී දර්ශන පෙන්වනවා පමණක් නොව ඒ ගැන රසකරමින් කියන වාර ගණන ද අසීමිත ය. ඔවුන්ගේ වාණිජ පරමාර්ථය මේ ආකාරයෙන් ඉටු වුවත් ඉන් සමාජයට වන බරපතල හානි අපමණ ය. ව්‍යාපාරිකයා පිනවා විශාල මුදලක් ලබා ගැනීමට උත්සාහ දරන දැන්වීම්කරුවා ජනතාවගේ සිත ආකර්ෂණය කර ගැනීමට වෙළෙඳ භාණ්ඩයේ නැති ගුණ වනයි. මාධ්‍යය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙලඹෙති. (ලකුණු 10 යි)

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

මුළු ලකුණු ප්‍රමාණය 10යි.

ලකුණු විග්‍රහය :


01. අන්තර්ගතය - ලකුණු 06යි.
02. වචන ගණන - ලකුණු 02යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02යි.

අන්තර්ගතය :

i. වෙළෙඳ ව්‍යාපාරවල එක ම අරමුණ අධික ලෙස මුදල් ඉපයීම යි.
ii. ඒ සඳහා වෙළෙන්දෝ විවිධ උපක්‍රම භාවිත කරති.
iii. ප්‍රචාරණයේදී සංස්කෘතිය පිළිබඳ ව අවධානය යොමු නො කිරීම කනගාටුදායක ය.
iv. මේ වෙළෙඳ උපක්‍රමවලට බොහෝ දෙනා රැවටෙති.
v. වෙළෙඳ දැන්වීම්වලින් වාණිජ පරමාර්ථ ඉටු වුවත් ඉන් සමාජයට වන හානිය බරපතල වේ.
vi. භාණ්ඩවල නැති ගුණ වර්ණනා කළත් මාධ්‍ය ගැන විශ්වාසය තබා ඇති නිසා ඒවා පරිහරණය කිරීමට මිනිස්සු පෙලඹෙති.

වචන ගණන 70 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 65 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 50 ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 70 ට වැඩිවන කල්හි හෝ 50 ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 හෝ 02 හෝ පිරිනමන්න. ඡේද බෙදා ඇත්නම් ලකුණු "0"යි.

### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 5%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 13%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 39%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 43%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු 10න් හරි අඩකට වැඩියෙන් එනම් ලකුණු 6ක් හෝ වැඩි ප්‍රමාණයක් හිමිකරගෙන ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 82%කි. ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබාගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 18%ක් පමණි.

අනිවාර්ය ප්‍රශ්නයක් වූ සාරාංශකරණය සඳහා ඉදිරිපත් වන ශිෂ්‍ය ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර ඔවුන්ගෙන් 82%ක බහුතරයක් ප්‍රදානය කෙරෙන ලකුණුවලින් අඩකට වැඩියෙන් ලබා ගැනීමට සමත් වී ඇත. ඒ අනුව ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 66% තෙක් වර්ධනය වී ඇත.

අයදුම්කරුවන් තුළ සාරාංශකරණය පිළිබඳ මනා පුහුණුවක් තිබිය යුතු ය. ඒ සඳහා නිරන්තර අභ්‍යාසවල යෙදීම අනිවාර්ය වේ. අපේක්ෂිත සාරාංශකරණය සඳහා ආකෘතියක් පහත දැක්වේ.

**සාරාංශකරණය**

වෙළෙඳ ව්‍යාපාරවල එක ම අරමුණ අධික ලෙස ලාභ ඉපයීම යි. ඒ සඳහා වෙළෙන්දන්ගේ උපක්‍රමශීලී අදහස් දැන්වීම්කරුවෝ ක්‍රියාවට නගති. ප්‍රචාරණයේ දී රටේ සංස්කෘතිය පිළිබඳ ව අවධානය යොමු නො කිරීම කනගාටුදායක ය. වෙළෙඳ උපක්‍රමවලට බොහෝ දෙනා රැවටෙති. වාණිජ පරමාර්ථ ඉටුකර ගැනීමට සකසන වෙළෙඳ දැන්වීම් මගින් සමාජයට වන හානිය ඉතා බරපතල ය. භාණ්ඩවල නැති ගුණ වර්ණනා කළත් මාධ්‍ය ගැන විශ්වාසයෙන් මිනිස්සු ඒවා පරිහරණය කිරීමට පෙලඹෙති.

### 04 ප්‍රශ්නය

අපේක්ෂණය : අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්‍ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න 5ක් ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිශ්චිත ව නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කරන ලද්දේ සියබස්ලකර විසිනි. කාව්‍යයේ ස්වරූපය හා වර්ණනා ක්‍රමය කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳ නීතිරීති මෙම ග්‍රන්ථය මගින් පනවන ලදි. මහාකාව්‍යය උසස් ම කාව්‍යය හැටියට සලකන ලදි. කව්සිළුමිණ වැනි ආදි ම පද්‍ය කාව්‍යයන් පටන්, ඉතා මෑත කාලයක ලියවුණු කාව්‍යයන් දක්වා, පැරණි සම්ප්‍රදායන් අනුව කවි ලියූ හැම කවියෙක් ම සියබස්ලකරින් නිශ්චිත, කවි සමය ගුරු කොට ගත්තේ ය. 'පෙදෙන් බුදු සිරිත් ඈ' යනාදි වශයෙන් පද්‍යයට වස්තු විය යුත්තේ බුද්ධ චරිතයක් බව සියබස්ලකරින් පැවසිණි. ඒ අනුව ගිය සිංහල කවීහු සිය කෘතීනට ජාතක කථා වස්තු කොට ගත්හ. කාව්‍යයේ අලංකාර ගැබ්විය යුතු යයි ද, සෘතු ආදි වර්ණනා ගැබ්විය යුතු යයි ද, යන අදහස සිංහලයේ පතුරුවන ලද්දේ සියබස්ලකර විසිනි.

සංස්කෘත කාව්‍ය ලක්ෂණ සිංහල කාව්‍යයට ඇතුළත්ව ඇති බවත්, සිංහල කවීන් සංස්කෘත පොත පත අනුගමනය කළ බවත්, පැරණි සිංහල සාහිත්‍යය පිරික්සන විචාරකයෝ පවසති. සිංහල කාව්‍යය අලංකාරවාදයේ ඵලයක් හැටියට හඳුන්වති. සකු කවියන් අනුව යැමට සිංහල කවීනට අනුබල දුන්නේ සියබස්ලකරයි. සිංහල කවීහු හැම දෙන ම සියබස්ලකරින් උගන්වන ලද කවි සම්ප්‍රදාය තදින් වැලඳ ගත්හ. අනුරාධපුර යුගයේ දී සියබස්ලකර වැනි ග්‍රන්ථයක් රචනා කිරීමෙන් ම පෙනී යනුයේ ඒ අවධිය වන විට බෙහෙවින් දියුණු වූ සිංහල කාව්‍ය සාහිත්‍යයක් බිහිව තිබුණු බවයි.

(i) පැරණි සිංහල කවීන්ගේ කවිසමය නිශ්චිත කෙරුණු සියබස්ලකරෙන් පනවන ලද්දේ කුමක් ද?
(ii) පැරණි සම්ප්‍රදායට අයත් හැම කවියෙක් ම ගුරු කොට ගත්තේ කවර දෙයක් ද?
(iii) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට සිංහල කවීහු සිය කෘතිවලට වස්තු විෂය කරගත්තේ මොනවා ද?
(iv) මෙහි සඳහන් වන ආදිම පද්‍ය කාව්‍යයක් වන ග්‍රන්ථයෙහි නම කුමක් ද?
(v) අනුරාධපුර යුගයේ දියුණු කාව්‍ය සම්ප්‍රදායක් පැවති බවට මෙම පාඨයේ ඇතුළත් සාක්ෂිය කුමක් ද?

(ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) කාව්‍යයේ ස්වරූපය හා වර්ණනා ක්‍රමය කෙසේ සකස් විය යුතු ද යන්න පිළිබඳ නීතිරීති/කාව්‍ය රචනය පිළිබඳ නීතිරීති/කාව්‍ය ආකෘතිය හා නිර්මාණය පිළිබඳ නීතිරීති.

(ii) සියබස්ලකරින් නිශ්චිත කවිසමය


(iii) ජාතක කථා

(iv) කව්සිළුමිණ


(v) සියබස්ලකර රචනා කිරීම/සියබස්ලකරින් නිශ්චිත කවි සමය ගුරු කොට ගැනීම/සියබස්ලකරේ ඉගැන්වීම් භාවිත වීම/සියබස්ලකර

* පිළිතුර නිශ්චිතව ම දක්වා නොමැති ව වාක්‍යයක් ලෙස අනවශ්‍ය විස්තර ලියා ඇත්නම් ලකුණු 01කි.

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 8%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 24%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 74%ක් වන අතර, 25%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක වී ඇත්තේ (i) කොටස සඳහා ය. එහි පහසුතාව 76% කි. (ii), (iii), (iv), (v) කොටස්වල පහසුතාව පිළිවෙළින් 60%, 63%, 62% සහ 73%කි. (ii), (iii) සහ (iv) කොටස්වල පහසුතාව අඩු මට්ටමක පවතින අතර (i), (v), කොටස්වල පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පවතී.

ඉදිරිපත් කර ඇති පාඨය ඇසුරෙන් අපේක්ෂිත අයදුම්කරුවන්ගේ අවබෝධය මැනීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත පත, මුද්‍රිත සඟරා ආදිය, පරිශීලනය සඳහා ඔවුන් යොමු කරලීම මෙන් ම පන්ති කාමරය තුළ අර්ථාවබෝධ අභ්‍යාස හුරු කිරීම ද කළ යුතු ය.

දෙන ලද පාඨය කියවා අසන ලද ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරු තෝරා ගැනීමේ හැකියාව ඇතැම් අපේක්ෂකයන්ට නො තිබුණු බව පැහැදිලි වන බැවින් අදාළ පිළිතුරු සෘජුව තෝරා ගෙන නිශ්චිතව ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් යොමු කළ යුතු ව ඇත.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් මධ්‍යස්ථ මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න පහේ පහසුතා 60%-77% අතර තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 67%ක පමණ මධ්‍යස්ථ අගයක් ගෙන ඇත.

මේ තත්ත්වය සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත් පත් පරිශීලනයට සිසුන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහි ලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද සිසුන් යොමු කළ යුතු වෙයි.

### 05 ප්‍රශ්නය

අපේක්ෂණය : මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත්පත්‍රිකාවක් සකස් කිරීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ රාජකාරි ලිපියක් ලිවීමයි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත් ගන්නා පරිදි නිර්මාණාත්මකව ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

**5.** මිරිහාන ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ දී සිදු කෙරුණු සාකච්ඡාවකින් කොටසක් පහත දැක්වේ. මින් අදාළ කරුණු පමණක් තෝරාගෙන වචන **100**කින් පමණ යුතු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රාදේශීය සභාවේ ලේකම් මහේන්ද්‍ර ජයලත් ඔබ යැයි සිතන්න.

- අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත එකතු වන අපද්‍රව්‍ය මගින් පරිසරයට විශාල හානියක් සිදු වෙනවා. වැහි කාලෙට වතුර බහින්නෙ නෑ. මදුරුවෝ බෝ වෙනවා. දුගඳ හමනවා.
- මිනිස්සු කිසිදු වග විභාගයක් නැතුව තමන්ගේ ගෙවල් අසල තියෙන හිස් ඉඩම්වලටයි පාරවල් අයින්වලටයි කුණු විසිකරන්න පුරුදු වෙලා.
- මේ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩමුළුවක් හැකි ඉක්මනින් ක්‍රියාත්මක කරන්න ඕනෑ.
- මේ සඳහා දිරාපත් වන හා දිරාපත් නොවන අපද්‍රව්‍ය වෙන වෙන ම ඉවත් කිරීමට අදාළ භාජන අපි නොමිලයේ ලබා දෙන්න ඕනෑ.
- දිරාපත් වන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය කරන්න දිරිගන්වන්නත් පුළුවන්.
- අපි කොහොමද මේ ව්‍යාපෘතියට මිනිස්සු යොමු කරන්නේ?
- ඕවි එතෙනදි අපි මෙහෙම කරමු. කාබනික පොහොර නිෂ්පාදනය හා දිරාපත් නොවන ප්ලාස්ටික්, වීදුරු වැනි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ගැන ගම්මට්ටමින් වැඩමුළු පවත්වලා මිනිස්සු දැනුවත් කරමු.
- මේ විදියට නිපදවන කාබනික පොහොර ප්‍රාදේශීය සභාව මගින් මිල දී ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරමු. ඒ මගින් වැඩි ම ආදායම් උපයන පුද්ගලයන්ට තව-තවත් ඒ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා මුදල් ආධාර ලබා දෙමු. මේ විදියට විධිමත් පරිදි කාබනික පොහොර නිපදවන අය අතුරෙන් 1, 2, 3 ස්ථානවලට පිළිවෙළින් රුපියල් 40 000, 30 000 සහ 20 000 බැගින් ද තවත් දිරිගැන්වීම සඳහා සහතික පත්‍ර ද දෙන්න පුළුවන්.
- මේ ගැන ප්‍රදේශයේ ජනතාව හැකි ඉක්මනින් දැනුවත් කරන්න ඕනෑ.
- ඒ සඳහා ආකර්ෂණීය අත් පත්‍රිකාවක් පිළියෙල කර බෙදා හැරීමට ලේකම්තුමාට පවරමු.

**නැතහොත්**

කොළඹට ඉතා දුරින් පිහිටි 'ඇතා වැටුණු වැව' ග්‍රාමයේ පවුල් 250ක් පමණ ජීවත් වේ. පොදුවේ මේ පවුල්වල ජීවත්වන්නන්ගෙන් බොහොමයක් තම ජාතික හැඳුනුම්පත ලබාගෙන නොමැත. විවිධ වූ පෞද්ගලික හා සමාජීය කටයුතුවල දී අත්‍යවශ්‍ය වන හැඳුනුම්පත කොළඹට නොගොස් තම ග්‍රාමයේ දී ම ලබා ගැනීම සඳහා ජංගම සේවාවක් පැවැත්වීමට විධිවිධාන යොදන මෙන් ඉල්ලා සිටිමින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න. ඇතා වැටුණු වැව ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ජයලත් මහින්ද ඔබ යැයි සිතන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.) (ලකුණු 15 යි)

### අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

අත්පත්‍රිකාව - ලකුණු 15යි.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබා ගන්න.

| | | |
|---|---|---|
| 01. | ආකෘතිය සඳහා | ලකුණු 05 යි |
| 02. | අන්තර්ගතය සඳහා | ලකුණු 07 යි |
| 03. | ශිල්පීය දක්ෂතා සඳහා | ලකුණු 03 යි |

01. ආකෘතිය සඳහා ලකුණු 04යි

| | | |
|---|---|---|
| 1. | මාතෘකාව | ලකුණු 01යි |
| 2. | පළකරන්නාගේ නම, තනතුර | ලකුණු 01යි |
| 3. | පළකරන දිනය | ලකුණු 01යි |
| 4. | නිර්මාණාත්මක බව | ලකුණු 02යි |

02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි

1. අපද්‍රව්‍ය නිසා පරිසරයට වන හානිය (ජලය ගලා නොබැසීම, දුගඳ හැමීම, මදුරුවන් බෝවීම. ලකුණු 01
2. මිනිසුන් අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම. ලකුණු 01
3. අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වැඩමුළුවක් පැවැත්විය යුතු බව. ලකුණු 01
4. අපද්‍රව්‍ය වෙන වෙනම ඉවත් කිරීමට භාජන නොමිලයේ ලබා දීම. ලකුණු 01
5. දිරාපත් වන අපද්‍රව්‍යවලින් කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම. ලකුණු 01
6. කාබනික පොහොර මිලදී ගැනීමේ වැඩ පිළිවෙළක් ඇරඹීම. ලකුණු 01
7. වැඩි ම ආදායම් උපයන අයට ත්‍යාග හා සහතික පත්‍ර ලබා දීම. ලකුණු 01

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 07 යි)

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- ★ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- ★ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

**නැතහොත්**

රාජකාරි ලිපිය ලකුණු 15

ලකුණු විග්‍රහය :

- ආකෘතිය 05
- අන්තර්ගතය 07
- ශිල්පීය දක්ෂතා 03

01. ආකෘතිය සඳහා ලකුණු 05

- යවන්නාගේ නම, ලිපිනය, දිනය ලකුණු 01
- ලබන්නාගේ ලිපිනය ලකුණු 01
- ආමන්ත්‍රණය ලකුණු 01
- මාතෘකාව ලකුණු 01
- තනතුර හා අත්සන ලකුණු 01

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.


02. අන්තර්ගතය සඳහා ලකුණු 07 යි

1. කොළඹට ඉතාදුරින් පිහිටි ඇතා වැටුණු වැව ග්‍රාමය ලකුණු 01
2. එහි 250ක් පමණ වන පවුල් සංඛ්‍යාවක් ජීවත් වීම ලකුණු 01
3. වැඩි දෙනෙකු ජාතික හැඳුනුම්පත ලබා නොතිබීම ලකුණු 01
4. විවිධ පෞද්ගලික කටයුතුවල දී ජාතික හැඳුනුම්පතෙහි අවශ්‍යතාව ලකුණු 01
5. විවිධ සමාජ කටයුතුවල දී එහි අත්‍යවශ්‍ය බව ලකුණු 01
6. තම ග්‍රාමයේදී එය ලබා ගැනීමට ජංගම සේවාවක් පැවැත්වීමේ අවශ්‍යතාව ලකුණු 01
7. ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමා වෙත කරන ඉල්ලීම ලකුණු 01

03. ශිල්පීය දක්ෂතා ලකුණු 03


04. ආකෘතිය සඳහා ලකුණු පිරිනැමීමේදී පැරණි ක්‍රමය හා නව ක්‍රමය යන දෙක ම පිළිගන්න.

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




5 ප්‍රශ්නය තෝරාගෙන ඇති අපේක්ෂකයින් සංඛ්‍යාව 92%කි. ලකුණු 15ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා
ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 47%ක් ද,
ලකුණු ලබාගෙන ඇත.

මෙම ප්‍රශ්නය යටතේ (අ) සහ (ආ) ලෙස ප්‍රශ්න දෙකක් ඇතුළත් ය. අපේක්ෂකයාට පහසු ප්‍රශ්නය තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව ලබා දී ඇත.




5 ප්‍රශ්නයේ (අ) කොටස සඳහා අපේක්ෂකයින්ගේ පහසුතාව 51% ක් ද, (ආ) කොටසෙහි පහසුතාව 67% ක් ද වේ. මේ අනුව මෙම ප්‍රශ්නයේ (ආ) කොටස පහසුතාව වැඩි කොටස ලෙස දැක්විය හැකිය.

අත් පත්‍රිකාවේ ආකෘතියට ලකුණු 5ක් ද, අන්තර්ගතයට ලකුණු 7ක් ද, ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3ක් ද වෙන් කර ඇත.

ප්‍රායෝගික ලේඛන යටතේ සැකසුණු රාජකාරි ලිපියේ ආකෘතිය සඳහා ලකුණු 05ක් ද, අන්තර්ගතය සඳහා ලකුණු 07ක් ද, ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03ක් ද වෙන් කර ඇත.

මෙහිදී අන්තර්ගතයට වෙන් කර ඇති ප්‍රධාන කරුණු හඳුනා ගැනීමට සිසුන් හුරු කළ යුතු ය. එසේ වූ කල්හි අන්තර්ගතයට වෙන් කර ඇති මුළු ලකුණු අපේක්ෂකයන්ට හිමි කර ගැනීමට පහසු වේ.

මෙම ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සතුටුදායක ය. නියමිත ප්‍රායෝගික ලේඛන ආකෘතියකට අනුව ලිවීම හුරුකළ යුතු ය. මෙබඳු ප්‍රශ්නවල පහසුතා මට්ටම ඉහළ නංවා ගැනීම සඳහා සුදුසු ආදර්ශ ලිපියක ආකෘතියක් පහත දක්වා ඇත.

විවිධ ප්‍රායෝගික ලේඛනවලට අදාළ ආකෘති පිළිබඳ ව අපේක්ෂකයන් දැනුවත් කොට ඒ පිළිබඳ ව අභ්‍යාසවල යෙදවීම සුදුසු ය.

ආදර්ශ ලිපියේ ආකෘතිය

ලියන්නාගේ නම/තනතුර
ලියන්නාගේ ලිපිනය
දිනය :

ලබන්නා
ලිපිනය
ආමන්ත්‍රණය

ලිපි ශීර්ෂය

* ලිපිය ලිවීමේ අරමුණ
* සම්බන්ධතාව
* අදාළත්වය/විස්තරය
* වර්තමාන ස්වභාවය/තත්ත්වය
* ඉල්ලීම/අවධානය

යොමුව
අත්සන
(නම)

## 2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 යි. මුළු ලකුණු 80 කි.

සිංහල භාෂාව හා සාහිත්‍යය III ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 7කින් සමන්විත ය.
මෙහි 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ.

නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳව අපේක්ෂකයින්ගේ අවබෝධය විචාරාත්මක හා තර්කානුකූල දැනුම, භාෂා ඥානය, සාහිත්‍යාවබෝධය හා රසවින්දන හැකියාව පරීක්ෂා කෙරෙන පළමු ප්‍රශ්නය සඳහා කොටස් දහයක් ඇතුළත් වේ. එක් කොටසක් අනුකොටස් දෙකකින් යුක්ත ය.එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

දෙවන ප්‍රශ්නය යොමු වන්නේ නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීමට යි. මෙහිදී නිර්දිෂ්ට පාඨ පහක් ලබාදෙන අතර ඒ එක් එක් පාඨය ආශ්‍රයෙන් ප්‍රශ්න දෙක බැගින් සැකසෙයි. එම නිර්දිෂ්ට පාඨවල අන්තර්ගත කාව්‍යෝක්ති, දුරවබෝධ පදවල අර්ථ හා අවස්ථා සම්බන්ධය පිළිබඳ විමසීම මෙහි දී අපේක්ෂිත ය. මේ සඳහා එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 20කි.


3-4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. මෙහි දී "නැතහොත්" යන්නෙන් අපේක්ෂකයින්ට විකල්ප ප්‍රශ්නයක් තෝරා ගැනීමට හැකියාව ඇත.

3, 4 ප්‍රශ්න දෙකේ ම මේ ලෙසින් විකල්ප ප්‍රශ්න තෝරා ගත හැකි ය. මේ සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලබා දේ.

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිත ව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීම යි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත.

**2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමග දක්වා ඇත.




(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයේ 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අනිවාර්ය වූ අතර එහි 1 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 61%කි. 2 වන ප්‍රශ්නය සඳහා පහසුතාව 38%කි.

3 වන ප්‍රශ්නය කොටස් 2කින් සමන්විත වූ අතර වැඩිම පහසුතාව 62%ක් ලබාගෙන ඇත්තේ 3 වන ප්‍රශ්නයේ I කොටසට වේ. එහි II කොටසට පහසුතාව 59%කි. (පිටුව 48)

4 වන ප්‍රශ්නය ද කොටස් දෙකකින් යුක්ත වන අතර I කොටසේ පහසුතාව 59%ක් වන විට II කොටසේ පහසුතාව 65%කි. (පිටුව 50)

5, 6, 7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එක් ප්‍රශ්නයකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂකයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක, තර්කානුකූල දැනුම හා රසඥතාව මැන බැලීම යි. මේ සඳහා ලකුණු 10ක් වෙන් කර ඇත. මෙකී ප්‍රශ්න අපේක්ෂක තෝරා ගැනීම මත සැකසුණකි. මෙහි දී වැඩි ම පහසුතාව 66% ලබාගෙන ඇත්තේ 7 වන ප්‍රශ්නයට වේ. අඩුම පහසුතාව 41%ක් වූ අතර එය 6 වන ප්‍රශ්නය සඳහා ලබා ගෙන තිබුණි.

**01. ප්‍රශ්නය**

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යුහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**.

(i) "අඟුල්මල් සොර 'රජ මා කරා එ' යනු දැනැ පළමු අවුදු දෙව්රම්හි හුන්නෙ යැ, රජු ගත,"

(අ) ඉහත සඳහන් පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.

(ආ) එම ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

(ii) රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන
සන්නාලියන් කොහොම ඇන්දා ද දේදුන්න
වැහි වතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට
කුරුල්ලෝ ඉගිල්ලී වරෙන් නුඹ මා ළඟට

(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් පද්‍ය පන්තියේ නම ලියන්න.

(ආ) එම කවි පෙළෙහි රචකයා නම් කරන්න.

(iii) (අ) 'අපට වැසිකිළියක්' කෙටි කතාව උපුටා ගත් කෙටි කතා සංග්‍රහය නම් කරන්න.

(ආ) 'අපට වැසිකිළියක්' කෙටි කතාවේ රචකයාගේ නම ලියන්න.

(iv) **වර** වෙණ නද අසමින් සිත සතොසිනි
**සර** හැර සියොතුන් පියපත් විදමිනි
පුර' ඔර වසමින් සිටි රඟ කුම් වැනි

(අ) මෙහි ඉතිරි කවි පදය ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(v) "රාළහාමි, ඇත්තට ම මේ ගැන මොකුත් ආරංචියක් දන්නවා ද? එයා මළ යි කියලා දැනගන්ඩ ලැබුණ ද?"

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(vi) වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණෙ වැඩ කළා නොවේ
වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ
වරද නැති කෙනෙක් නැත සකිය මේ ලොවේ

(අ) මෙම කවියේ 'සකිය' යන්නෙහි අර්ථය ලියන්න.

(ආ) මෙම කවිය කවර ජන කවි ගණයට අයත් ද?

(vii) (අ) ජාතක කතා මුල් කරගත් **ගී කාව්‍ය** ග්‍රන්ථ **දෙකක්** ලියන්න.

(ආ) උම්මග්ග ජාතකයෙහි සතර කන් මන්ත්‍රණය සිදුවන්නේ කවුරුන් අතර ද?

(viii) දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි

(අ) ඉහත ගීත ඛණ්ඩය ඇතුළත් ගීතයේ රචකයාගේ නම ලියන්න.

(ආ) 'දහදිය මුතු ඇට' යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?

(ix) (අ) 'දියමන්ති මාලය' කෙටි කතාවේ මුල් රචකයාගේ නම ලියන්න.

(ආ) නිර්දිෂ්ට 'දියමන්ති මාලය' කෙටි කතාව සිංහල භාෂාවට පරිවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(x) ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරැරා
අසන නිතියෙනා

(අ) ඉහත සඳහන් කොටස උපුටා ගත් නිර්මාණය කුමක් ද?

(ආ) මෙහි 'ප්‍රේමවන්ත දරුවෙනි මා' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කා හට ද?

(ලකුණු 02 × 10 = 20 යි)

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) අමාවතුර
(ආ) ගුරුළුගෝමී

(ii) (අ) වස්සානය
(ආ) රත්න ශ්‍රී විජේසිංහ

(iii) (අ) නොනිමි සිත්තම හා තවත් කෙටිකතා
(ආ) කේ. ජයතිලක

(iv) (අ) සුර සෙනඟට සුර'සුන් පැන වූ වැනි
(ආ) වර - උතුම් / විශිෂ්ට / උසස් / ශ්‍රේෂ්ඨ / ප්‍රශස්ත
සර - ගමන් / සංචාරය / පියාසර / චලනය / සැරිසැරීම / පියෑඹීම / පියාසැලීම

(v) (අ) පුංචිමැණිකා
(ආ) බැද්දේගම

(vi) (අ) මිතුර / යහළුව / සබඳ / සගය / මිත්‍රය
(ආ) උපදේශාත්මක ජන කවි / උපදෙස් සඳහා කී කවි / දැනමුතුකමට කී කවි


(vii) (අ) මුවදෙව්දා වත, සසදා වත, කව්සිළුමිණ
(ආ) චූලනී බ්‍රහ්මදත්ත / බ්‍රහ්මදත්ත / උත්තර පංචාල නුවර බ්‍රහ්මදත්ත රජු හා කේවට්ට බමුණා අතර

(viii) (අ) මහගමසේකර
(ආ) රූපක


(ix) (අ) ගී ද මෝපසාං
(ආ) කේ.ජී. කරුණාතිලක

(x) (අ) සිංහබාහු නාට්‍යය
(ආ) සිංහබාහුට හා සිංහසීවලීට

### 1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 99%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ 10ට අඩුවෙන් ලබාගත් පිරිස 35%කි.




මෙම ප්‍රශ්නයේ අනුකොටස් 10කි. ඒ අතුරෙන් I කොටස (අ), (ආ) අනුකොටස් සඳහා පහසුතාව පිළිවෙළින් 80%ක් හා 81%ක් විය.

පහසුතාව අඩු ම කොටස් වන්නේ iv කොටස vii (අ) අනුකොටස viii (ආ) අනුකොටස වන අතර ඒවා අනුපිළිවෙළින් 21%, 43%, 36% විය. පොදුවේ ගත් කල සෙසු ප්‍රශ්න සඳහා පහසුතාව 50% සිට 79% දක්වා ලබාගෙන ඇත.

මෙසේ වීමට හේතු ලෙස පහත සඳහන් කරුණු ඉදිරිපත් කළ හැකි ය. ප්‍රශ්නයේ (iv) කොටස, ගුත්තිල කාව්‍යයෙන් දී ඇති පද්‍යයක පද පූරණය කිරීමට ද, (vii) කොටස (අ) අනුකොටස ජාතක කතා මුල් කරගත් ගී කාව්‍ය ග්‍රන්ථ දැක්වීමට ද (viii) කොටස (ආ) අනුකොටස කාව්‍යාලංකාර පිළිබඳ ව නිශ්චිත ව පිළිතුරු සැපයීමට ද බොහෝ අපේක්ෂකයන් අපොහොසත් වී ඇත. නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනයේ දුර්වලතාව මේ සඳහා බලපා ඇති බව පෙනිණි.

### 02 ප්‍රශ්නය

**අපේක්ෂණය :** දෙවන ප්‍රශ්නය ද අනිවාර්යය. මෙහිදී නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇතිව පාඨයෙහි අදහස දෙනු ලබන තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව නිසි ලෙස ලියා ඉන්පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලිවීමේ කුසලතාව මැන බැලීම මෙහිදී මූලික අපේක්ෂාව විය.

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "කොල, වහා මේ නුවර ඒ ඒ දිගින් අගල මැඬ හස්වා පවුරු, දොරටු, අටලු, වාසල්, බලකොටු ආදිය බිඳ, සුනු විසුනු කෙරෙමින් වහා නුවරට වැද, ගැල් පුරා ගෙන'වුත් කොමඩු බානා සේ මහා ජනයා ඉස් කපා ගනුව; වේදේහ රජහු ඉසත් වහා ගෙනෙව" යි කීහ.

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii)

තත මතු ද සින්දේ
**පිළිමල්** දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය **සිරි සඳ** ගෙන වැලැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(iii) 'සොර ක්ලාන්ත වී යැ. මියෙහි කෙළ සිඳී ගියෙ. ශරීරයෙන් ස්වේද බස්සි.'

(අ) පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) නිල තුරඟුට නැඟෙමින් රිවි දෙව් සිරිත
දුල කැරැ සේසත් මිණි බරණ කිරණිත
බල පිරි සෙත් සහ යාපා පටුන් ගෙන
බල සේනානායක සපු කුමරු එන

(අ) බබළවමින් සහ සූර්යයා යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන **දෙක** ලියන්න.
(ආ) යාපා පටුන ජයගෙන සපුමල් කුමරුන් පැමිණෙන ආකාරය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(v) කැර මිණි බරණ රැස්
රසින් **සුරසැවු** සුවහස්
සුරන් සහ **සහසැස්**
නො කැර සිටියේ අහස් කුස හිස්

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) කවියේ අර්ථය ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

2. (i) (අ) කොමඩු බානා සේ
(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජ, එක් සියයක් රජ දරුවන් හා සේනාව සමග ගොස් මියුලු නුවර වටලා ගෙන සිටියදී එම නගර වැසියන් සැණකෙළි පැවැත්වීමට හේතුව චර පුරුෂයකුගෙන් අසා දැන ගත් බ්‍රහ්මදත්ත රජතුමා කෝපයට පත් ව තම සේනාවට දුන් උපදෙසකි.

(ii) (අ) පිළිමල් - ප්‍රතිමල්ලව / විරුද්ධවාදීන් / සතුරන් / ප්‍රතිවාදීන්/ පසමිතුරන්
(ආ) සිරිසඳ - ශ්‍රී සම්පත්තිය / ශ්‍රියා කාන්තාව / ශ්‍රීය / සිරිකත


සින්දේ වීණා තත පමණක් නො වේ. සතුරාගේ ආඩම්බරය ද සුන් කර දමා කීර්තිය සියලු දිශාවන්හි පැතිරවිය. විජය ශ්‍රී කාන්තාව කැඳවා වැලඳ ගත්තේ ය.

(iii) (අ) සොරා ක්ලාන්ත බවට පත් විය. කටෙහි කෙළ සිඳී ගියේය. සිරුරෙන් දහඩිය වැගිරෙයි.
(ආ) අංගුලිමාල බුදුරදුන් පසුපස හඹා ගොස් වෙහෙසට පත් වූ අවස්ථාව.


(iv) (අ) බබළවමින් - දුල කැරැ
සූර්යයා - රිවි දෙව් /රිවි
(ආ) සූර්ය දිව්‍ය රාජයාගේ ආකාරයෙන් කළු (නිල්) අසු පිට නැඟී, මැණික් ආභරණවල කාන්තියෙන් සේසත බබළවමින්, යාපා පටුන ජය ගෙන බලයෙන් පිරුණු සේනාව සමඟින්

(v) (අ) සුරසැවු - දේදුනු / ඉඳුදුනු / ඉන්ද්‍රචාප / දෙව්දුන්න / ඉඳුසැව්
සහසැස් - ශක්‍රයා / සුර රද / සුරිඳු/ වජිරපාණී
(ආ) මාණික්‍ය ආභරණ රාශීන්ගේ රශ්මියෙන් බොහෝ දේදුනු ලක්ෂ ගණන් ඇති කොට ශක්‍ර තෙමේ දිව්‍ය සේනාවන් හා අහස් කුස පුරා සිටියේය.

## 2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




අයදුම්කරුවන්ගේ ප්‍රතිචාරයන් දෙස බැලීමේදී මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිචාරය 96%ක ප්‍රතිශතයක් ගත්ත ද නිවැරදි පිළිතුරු ඉදිරිපත් කිරීමේදී අඩු ප්‍රතිශතයක් ගෙන ඇත. ඒ අනුව
ඉන් ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 38%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයෙහි 28%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයෙහි 20%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 14%ක් ද
ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හෝ 10ට අඩුවෙන් ලබාගත් පිරිස 66% කි.




මෙම ප්‍රශ්නයේ අනු කොටස් (i, ii, iii, iv, v) සඳහා පහසුතාව I කොටස (අ) 79%ක් ද, (ආ) 25%ක් ද, II කොටස (අ) 30%ක් ද, (ආ) 26%ක් ද, III කොටස (අ) 56%ක් ද, (ආ) 33% ක් ද, IV කොටස (අ) 41%ක් ද (ආ) 37%ක් ද, v කොටස (අ) 29%ක් ද, (ආ) 26%ක් ද විය.

මෙහිදී II සහ V කොටස්වල පහසුතාව අඩු මට්ටමක පැවතුණි. මෙම ප්‍රශ්න කොටස් දෙකෙන් ම දී ඇති පද්‍යවල අර්ථය ලියා දැක්වීම අපේක්‍ෂා කෙරිණි. ගුත්තිල කාව්‍යය ඇසුරෙන් මෙම ප්‍රශ්න කොටස් දෙක ම සැකසී තිබිණි. උම්මග්ග ජාතකය හා අඟුල්මල් දමනය යන පාඩම් ඇසුරෙන් අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම මැනෙන I කොටසෙහි (ආ) අනුකොටසත් III කොටසෙහි (ආ) අනුකොටසත් සඳහා පහසුතා පිළිවෙළින් 25%ත් 33%ත් විය.

පුරාතන ගද්‍ය සාහිත්‍යයට අයත් පාඩම්වල කතා සාරය, අවස්ථා හා සිද්ධි මතකයේ රැඳෙන ආකාරයට ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර එමගින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම් වර්ධනය කරගැනීමට යොමු කිරීම වැදගත් වේ. නිර්දිෂ්ට සාහිත්‍ය කොටස් ඇසුරෙන් නිරන්තර අභ්‍යාසවල යෙදවීම තුළින් සාර්ථක පිළිතුරු අපේක්‍ෂා කළ හැකි ය.

**03 ප්‍රශ්නය**

**3.** (i) උපයුක්ත භාෂා රීතිය සහ

(ii) යෝග්‍ය උපමා භාවිතය

**උම්මග්ග ජාතකයේ සාර්ථකත්වයට හේතු වී ඇත. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.**

## අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

(i) උපයුක්ත භාෂා රීතිය

* කතාව කීමේදී කෙටි වැකි යොදා ගැනීම.

"එසමයෙහි උත්තර පඤ්චාල නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවනට කේවට්ට නම් බමුණු කෙනෙක් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නාහ. ඌ තුමූ නුවණැත්තාහ. වියත්තාහ.........."

"ඒ තෙමේ සමීපයෙහි සිටි එකකුට එපවත් කීය. එයිත් "යමක් තමන්ට රුචි වී නම් ඒ තොපට දෙමියි කියා වේද උන් කීයෙ? උන් දෙනු කැමති දෙයක් හැර ගනුවයි කීයේය....."

* සංස්කෘත තත්සම වදන් මිශ්‍ර වාක්‍ය භාවිතය.

"ගන්ධදාම පුෂ්පදාමාවලම්බිත නානා වර්ණ විචිත්‍ර විතානෝපලක්ෂිත අලංකෘත ශ්‍රී යහන් ගර්භය බලන්නාහු......"

"කොල පව්ටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල......."

"උපමා විෂයාතික්‍රාන්ත වූ ශ්‍රී සෞභාග්‍යයෙන් යුක්ත වැ ඒ අෂ්ට වංක මාණික්‍ය රත්නය අතින් ගෙනැ......"

* නාට්‍යරූපී දෙබස් සහිත වාක්‍ය යොදා ගැනීම.

"දරුව, මසු දහස තොපට අභිප්‍රාය දැයි විචාරා එසේ ය කැමැත්තෙමි යි කී කල දරුව තොප විසින් මින් මට යමක් රුචි වී නම් ඒ දෙමියි. මෝ හට කියන ලද ද නො කියන ලද දැයි කියා......"

"කිමෙක්ද පුත, මහෝෂධ පණ්ඩිතයෙනි?යි රජ්ජුරුවන් කී කල්හි .ධර්ම යුද්ධයට යෙමි'යි වදාළ සේක. පුත මා විසින් කුමක් කළ මනා දැයි කීහ. දේවයන් වහන්ස කේවට්ටයා මැණිකකින් වංචා කරනු කැමැත්තෙමි......"

* සරල සිංහල රීතිය මතු කෙරෙන වාක්‍ය භාවිතය.

"එක් දවසක් මිනිසෙක් සහල් හැළියක් ද බත් මුළක් ද මසුරන් දහසක් ද හැර ගෙන ගඟින් එතෙර වෙමි යි ගඟ මැදට ගොස් දිය සැඩ හෙයින් එතෙර වූ ගඟ ......."

"පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයාට කළමනා සත්කාර කොට හෙවත් මීයෙන් තැනූ විලඳ කවා බේත් තෙලින් පියා සඟල මැඩ......."

(ii) යෝග්‍ය උපමා භාවිතය

* සාල්ලෙක ලාලා පාතට බානා කෙනෙකු මෙන්
* දණ්ඩෙන් ගසන ලද ආශීර්විෂයක්හු මෙන්
* තල්පැන් පලක් මඬනා සේ
* දණ්ඩකින් පහරන ලද සර්පරාජයකු සේ
* කොක් කරක් සේ දික්වූ කර ඇති වූහ.

රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ පුද්ගලයින්ගේ හා අවස්ථාවන්හි ස්වභාවයට අනුකූලව මෙවැනි උපමා යෙදී ඇත.

ඇතැම් විට උපමා කීපයක් ද එකට යෙදුණු තැන් දක්නා ලැබේ.

* රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දක්නා වෙදකු පිළිසරණ වන්නා සේද
* සා දුකින් පෙළෙන එකකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේද
* පිපාසා ඇති එකකුට පැන් පුවහොත් මුත් පිපාසය නොසන්සිඳෙන්නා සේද
* රශ්ගල් තලා මස්තකයෙහි නාද කරන සිංහ රාජයකු මෙන්
* කැටක් ගෙන වඳුරු රැසක් පලවන එකක්හු මෙන්ද
* දුන්නක් අල්ලා ගෙන වඳුරු මුළක් පලවන එකක්හු මෙන් ද
* නිගණ්ඨ සේනාවක් පරිද්දෙන්
* සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන්
* ශක්‍ර පුරයට වන් අසුර භටයන් පරිද්දෙන්

මේ ආදී උපමා යොදා ඇත්නම් පිළිගන්න.

**උදාහරණ සඳහා ලකුණු 04 යි**
**සමස්ත විස්තරයට ලකුණු 11 යි**
**මුළු ලකුණු 15 යි**

**නැතහොත්**

(i) දාරක ස්නේහය සහ

(ii) ස්වාමි භක්තිය

අතර දෝලනය වන චරිතයක් වශයෙන් සුප්පා දේවියගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය සිංහබාහු නාට්‍යයේ නිර්දිෂ්ට කොටස ඇසුරෙන් සාකච්ඡා කරන්න. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් සපයන්න.

(ලකුණු 15 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) දාරක ස්නේහය

* දරුවන් ප්‍රිය වදනින් ඇමතීම

  "මා ප්‍රිය පුතණුවනි හා දුවණියනි, මා වෙත එනු මැන. ප්‍රේමවන්ත දරුවෙනි මා හිඳිනු කන් යොමා...."

* දරුවන් ළඟට ගෙන විසිතුරු කතා කියා දීම

  "ඔබ පා මුල හිඳුවා මා
  වැඩෙන වයසෙ දි
  රාජ කතා කී විසිතුරු
  දැන් සිහි වන්නේ......"

* දරුවන් නඟන ප්‍රශ්නවලින් ඔවුන් තේරුම් ගැනීම

  "සඟවන්ට තතු බැරිය පුතුගෙන්
  මිගි නිති සොඳිනා පෙනෙන විලසා
  අදහන් නැත කීවද මුසා
  නැණ මුකුරා ගොස් ඇත පුරා වයසා"

* ඇත්ත තතු දරුවන් ඉදිරියේ නොසඟවා කීම.

  "ඔබ පියාණෝ නරයකු නොව වනයෙහි දී මට හමු වූ සිංහ රාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රාජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි දරුවෙනි."

* දරුවන්ගේ සුභසිද්ධිය පතා ඔවුන් ගත් මග අනුමත කිරීම

  "දරුවන් දෙදෙනා හට සෙත් ලැබෙනා
  මග ඔස්සේ යා යුතු වන්නේ
  නොසැලේ කිසි මේ වේලේ......."

(ii) ස්වාමි භක්තිය

* ස්වාමියා හැර නොයන ලෙසත් තනි නොකරන ලෙසත් කියා දරුවන්ට ඔහුගේ ගුණය වටහා දීම.

  "මෙවන් බස් දොඩනු කිම
  ඔබ පියා හැර දමා
  යා හැකිද මේ ලෙනෙන්
  අප නැතිව පියා ඔබ
  ළය පැළී මැරී යයි"

* සැප සම්පත් හැරදමා ස්වාමියා සමඟ ප්‍රේමයෙන් බැඳී කල් ගෙවීම

  "මේ සියල්ල හැර දා මම
  ආවෙමි වලටා
  වෙසෙන ලෙසා ඔබෙ පිය මා
  සමිඳුන් සමඟා....."

* ස්වාමියා හා සතුටින් ජීවත් වූ බව දරුවන් ඉදිරියේ පැවසීම

  "පුරුදු වූ වන වාසෙ
  මෙහි සැපත නොසෑහෙද
  ඔබ පියා සමඟිනා
  මෙතෙක් කල් වින්ද මා......"

* සැමියා හැරයාමට සිදුවීම ගැන කම්පා වීම


"මා මෙසේ කරන්නේ හද තුළ ඇති වේදනාවකිනි. දිවි හිමියෙන් මා වේදනාවෙන් පෙළෙන බව දනිමි....."

* ස්වාමියා හැරයාමට සිදු වීම ගැන සමාව අයැදීම හා ඔහුට ආශිර්වාද කිරීම

"දෙවියන් බාරයි මා සමිදා
මා වෙත නොවනුය කෝපා
දරුවන්
කරනෙමි මෙබන්දා
සිහිවේ හැමකල්
සමා වනු ඇත වරදා"


**(උදාහරණ සඳහා ලකුණු 04 යි, සමස්ත විස්තරයට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)**

### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




තුන්වන ප්‍රශ්නය ද අනිවාර්ය වූවකි. මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් පිළිතුරු සපයා ඇත්තේ 89% පමණි. මෙම ප්‍රශ්නයට ලකුණු 15ක් හිමිවෙයි.

ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙන් 22%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙන් 23%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙන් 31%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙන් 24%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.මෙම පශ්නය සඳහා ලකුණු 07ක් හෝ 07ට අඩුවෙන් ලබාගත් පිරිස 45% කි.




මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

එම ප්‍රශ්න දෙක අතුරෙන්, පළමුවන ප්‍රශ්නයෙහි පහසුතාව 62% කි. **නැතහොත්** ප්‍රශ්නයෙහි පහසුතාව 59% කි.

මෙහි පළමුවන ප්‍රශ්නයේ පහසුතාව **නැතහොත්** ප්‍රශ්නයේ පහසුතාවට වැඩි වී ඇති බව පෙනේ. පුරාතන සාහිත්‍යයේ ගද්‍ය කොටසක් වන සතරකන් මන්ත්‍රණය පාඩම ඇසුරෙන් සකසා තිබුණු පළමු වන ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට වඩා සිංහබාහු නාට්‍යය ඇසුරෙන් සැකසුණ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ පහසුතාව අඩු වී ඇත. නාට්‍ය රසවින්දනය සම්බන්ධයෙන් අපේක්ෂකයන් තුළ පරිචයක් ඇති කිරීමට සුදුසු ඉගැන්වීමේ ක්‍රම අනුගමනය කිරීමට ගුරුභවතුන් යොමු විය යුතු අතර නාට්‍ය පෙළ ගැඹුරින් අධ්‍යයනය කිරීමට අපේක්ෂකයින් ද යොමු විය යුතුය.

සමස්තයක් වශයෙන් ගත් කල මෙකී ප්‍රශ්න පිළිබඳ පන්ති කාමරයේදී සාකච්ඡා කිරීම හා ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම තුළින් නිර්දිෂ්ට කෘති කෙරේ අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර වර්ධනය කර පිළිතුරු සැපයීමේ හැකියාව සතුටුදායක මට්ටමකට ළඟා කරගත හැකි වනු ඇත.

04 ප්‍රශ්නය

**4.** (i) පවතින දේ ඇති සැටියෙන් වර්ණනා කිරීමට සහ

(ii) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීමට

සැළලිහිණි සන්දේශ කතුවරයා දක්වන සාමර්ථ්‍යය එක් කොටසකට උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විස්තර කරන්න.

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

(i) පවතින දේ ඇති සැටියෙන් වර්ණනා කිරීම
- අග පිපිමල් මලිගිය ලිය කැලේයා
- මල්දම් සුවඳ දුම් දුන් සොඳ වරලසිනි
- රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී
- මග නිලමින් සිටි නා දොඹ නී පියල
- කස්තුරි තිලක සැදි නළලත සුමුටාන

(ii) උචිත කාව්‍යෝපක්‍රම භාවිතය

අනුප්‍රාසය - "වළඳින අදහසින් මෙන් සුරගඟ අඟන / අග පිපි මල් මලිගිය ලිය කැලේයා."

මුල මැද අග එළිසමය - රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී.

උපමා - නිමල් සඳ පහන් වැනි වැලි පිට උදුල / නිල තුරඟුට නැඟෙමින් රිවිදෙව් සිරින

රූපක - කර පුද වඩින රුදි මුනි සිරිපා තඹර

ඉහත දැක්වෙන අංශ දෙක ගැනම කරුණු දක්වා තිබීම අවශ්‍ය වේ. ගැළපෙන වෙනත් නිදසුන් දක්වා ඇති නම් පිළිගන්න.

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

**(උදාහරණ සඳහා ලකුණු 04 යි, සමස්ත විස්තරයට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)**

**නැතහොත්**

(i) ජන කවියේ ඇති අව්‍යාජභාවයත්

(ii) භාෂා භාවිතයේ සරලත්වයත්

කුරක්කන් කවිවලින් නිරූපණය වේ. එක් කරුණක් සඳහා උදාහරණ **දෙක** බැගින් නිර්දිෂ්ට කවිවලින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

**නැතහොත්**

(i) ජනකවියේ අව්‍යාජත්වය

"දුරුතු මහේදී කැලයට වැදිලා"

"මා කී දේ දෙයියනි බොරුවක්ම නැති"

"හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්"

"කටු ඇල්ලේ මහ හේනේ කුරක්කන්"

"මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්"

(ii) භාෂා භාවිතයේ සරල බව.

හේනේ පැලේ මා විඳිනා සුරුක්කන්

මෙදා හේනේ පැහිලා ඇති කුරක්කන්


කුරක්කන් තුනයි වැපිරුවෙ අමාරුවේ

එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්

ඉහත සඳහන් අංශ දෙක සඳහා දී ඇති නිදසුන් හෝ වෙනත් නිදසුන් දක්වා පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

**(උදාහරණ සඳහා ලකුණු 04 යි, සමස්ත විස්තරයට ලකුණු 11 යි, මුළු ලකුණු 15 යි)**


## 4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




අනිවාර්ය ප්‍රශ්නයකි. එය ද අයදුම්කරුවන්ගේ පහසුව සඳහා කොටස් දෙකකින් යුක්ත ය.
පළමු කොටසේ සඳහන් වී ඇත්තේ සැළලිහිණි සන්දේශ ඇසුරෙන් සැකසුණු ප්‍රශ්නයකි.

නැතහොත් ප්‍රශ්නය කුරක්කන් කවි පාදක කරගෙන සැකසී ඇත.

ලකුණු 15කින් සමන්විත මෙම ප්‍රශ්නය සඳහා
ලකුණු 00-03 ප්‍රාන්තරයෙන් 23%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙන් 19%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙන් 27%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙන් 31%ක් ද
ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 07ක් හෝ 07ට අඩුවෙන් ලබාගත් පිරිස 42% කි.




4 ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වූ අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

මෙහිදී "සැළලිහිණි සංදේශය" ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලබාගත් පහසුතාව 59% වන අතර කුරක්කන් කවි ඇසුරෙන් සකස් වූ **නැතහොත්** ප්‍රශ්නයට ලබාගත් පහසුතාව 65%කි. ඒ අනුව ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු ගොනු කිරීමේදී කුරක්කන් කවි ඇසුරෙන් උදාහරණ සැපයීම "සැළලිහිණි සංදේශය" ඇසුරෙන් උදාහරණ සැපයීමට වඩා සංකීර්ණ වීමක් දැකිය හැකි විය.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න පිළිබඳ ව අයැදුම්කරුවන් දැනුවත් කිරීමත් ප්‍රශ්නයකට අදාළ ව පිළිතුරු ගොනු කර ගැනීමට හුරුකිරීමත් අවශ්‍ය බැවින් පන්ති කාමරයේ දී ඒ පිළිබඳ අවධානය යොමු කිරීමට ගුරුභවතුන් කටයුතු කළ යුතු බව අවධාරණය කෙරේ.

05 ප්‍රශ්නය

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

**5.** දේශාභිමානී හැඟීම් ළමා සිත් තුළ ජනිත කරවීමට උචිත ලෙස බස හැසිරවීමෙහි ලා කවියා සතු දක්ෂතාව 'ජාතික තොටිල්ල' පැදිපෙළ තුළින් මනාව ඉස්මතු වේ. නිර්දිෂ්ට කොටසින් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න.
(ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- දේශාභිමානී හැඟීම් සඳහා නිදසුන්

★ නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මෙලො වේ
යුතුකම ඉටුකළ යුතු වේ


★ ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මොහොතේ
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

★ තමන් ලැබූ දිවි පෙවෙතේ
කොටසක් රට සමය වෙතේ
පුද නොකළොත් උඹෙන් පුතේ
මෙලොවට කිසි පලක් නැතේ

★ ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගන්න.)
**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**




මෙම ප්‍රශ්නය "ජාතික තොටිල්ල" පැදි පෙළ ඇසුරෙන් සැකසී ඇත.

අයදුම්කරුවන්ගෙන් 50%ක් පමණ ඊට පිළිතුරු සපයා තිබිණ. සමස්ත පහසුතාව 60%කි. ලකුණු 6ත් 10ත් අතර ලබාගෙන ඇති ප්‍රතිශතය 71%කි. 29%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 06ට අඩුවෙනි.

ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇති ලකුණු ගණනය කිරීමේ දී
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 12%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 17%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 28%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 43%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




නිර්දිෂ්ට නූතන සාහිත්‍ය කෘති පිළිබඳ ව වැඩි අවධානයක් යොමු කිරීමත්, ඒ ඇසුරෙන් විමසිය හැකි ප්‍රශ්න කෙරෙහි අයැදුම්කරුවන්ගේ අවධානය යොමු කිරීමත්, නිරන්තර අභ්‍යාසවල යෙදවීමත් මගින් මෙවැනි ප්‍රශ්නවලට උපරිම ලකුණු ලබා ගැනීමට අවස්ථාව සැලසිය හැකි ය. ඒ පිළිබඳ ව ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු බව අවධාරණය කෙරේ.

ප්‍රශ්න අංකය - 06

**6.** සාමාන්‍ය සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීමට 'දියමන්ති මාලය' කෙටි කතාකරුවා සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

- ★ සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ ජීවිතවල යථා ස්වභාවය නිරූපණය කිරීම සාර්ථක කෙටි කතාවක ලක්ෂණයකි.

- ★ මිල මුදල් අග හිඟ දුෂ්කරතා තිබුණද, සෑම ගැහැනියක ම අන් අය ඉදිරියේ කැපී පෙනෙන ආකාරයට ජීවත් වීමට කැමති බව හෙළි වීම.

  නිදසුන් : "පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක තරම් ලැජ්ජා නැති වැඩක් නෑ,
  "කනේ කරේ දා ගන්න මුකුත් ම නැතිකම ගැනයි මං මේ දවස් ටිකේම කල්පනා කර කර සිටියේ. මේක මගේ හිතට ලොකු අමාරුවක්"

- ★ නොසිතූ කරදරයක් වූ අවස්ථාවක දී ණය වීම.

- ★ මැටිල්ඩා තම යෙහෙළිය වූ ෆොරෙස්ටියර් මහත්මියගෙන් ඉල්ලා ගත් දියමන්ති මාලය නැති වූ විට ණයට හා පොලියට මුදල් ලබා ගෙන මාලයක් මිල දී ගෙන එය භාර දී එම ණය සහ පොලී මුදල් ගෙවීම සඳහා දිවා රෑ නොබලා වෙහෙසීම.

- ★ ණය බරින් මිරිකුණත් ඒ බව සමාජයට නොඅඟවා ජීවත් වීම.
- ★ තමාට නොගැළපෙන විවාහයක් කර ගැනීමට සිදු වීම පිළිබඳව මානසිකව පසු තැවීම.

- ★ තමාගේ දුක්, කරදර හා අසන්තෝෂය පිටතට නොපෙන්වා ජීවත් වීමට උත්සාහ ගැනීම.

- ★ තම බිරිඳගේ රූමත්කම පිළිබඳව අන් අයට ප්‍රදර්ශනය කිරීමට සැමියා තුළ ඇති කැමැත්ත.

- ★ සෑම අයෙකුම තමා ජීවත් වන සමාජ තලයට වඩා ඉහළ සමාජ තලයක අය ඇසුරු කිරීමට කැමති බව, මධ්‍යම පාන්තික ආකල්ප.


★ දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වී වැඩ කළත් අඩු ආදායමක් ඉපයීම.
"ඇගේ සැමියා සවස් කාලයේදී කිසියම් වෙළෙන්දෙකුගේ ගිණුම් වාර්තා සකස් කිරීමෙහි යෙදුණේ ය. බොහෝ විට රාත්‍රි කාලය ඔහු ගත කළේ පැන්ස බාගයකට පිටුව ගණනේ පිටපත් කිරීමෙනි"

★ සැමියා බිරිඳගේ සතුට වෙනුවෙන් කටයුතු කිරීම.
(ප්‍රිය සම්භාෂණයට සහභාගි වීමේ අවස්ථාව ලබා ගැනීම. ඇයට අවශ්‍ය ඇඳුමක් ලබා ගැනීමට මුදල් දීම.)


මෙයින් උදාහරණ තුනක් ඉදිරිපත් කර තිබේ නම් සාර්ථක පිළිතුරක් සේ පිළිගන්න.

**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 15%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.
ඉන් ලකුණු 00-02 අතර ප්‍රාන්තරය 28%ක් ද
ලකුණු 03-05 අතර ප්‍රාන්තරය 29%ක් ද
ලකුණු 06-07 අතර ප්‍රාන්තරය 23%ක් ද
ලකුණු 08-10 අතර ප්‍රාන්තරය 20%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.




දියමන්ති මාලය කෙටි කතාව ඇසුරෙන් ලිවීමට තිබූ මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 41%කි. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයැදුම්කරුවන්ගෙන් 57%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 06ට අඩුවෙනි. 6ත් 10ත් අතර ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 43%කි.

5, 6, 7, යන ප්‍රශ්නවලින් අඩුම පහසුතාවක් ද ලබා ගෙන ඇති මෙම ප්‍රශ්නයට අඩු ලකුණු ප්‍රමාණයක් ලැබීමට හේතු වී ඇත්තේ නිර්දිෂ්ට කතාව පිළිබඳ ව අයදුම්කරුවන්ගේ අවධානය නිසි පරිදි යොමු වී නො තිබීමත්, පරිවර්තන කෙටි කතා සාහිත්‍යය පිළිබඳ අවබෝධ කර ගැනීමට අවශ්‍ය නිසි මගපෙන්වීමක් නො ලැබීමත් බව පෙනෙයි.

## 07 ප්‍රශ්නය

**7.** 'ගංගාවේ සංගීතය' පැදිපෙළ රචනයේ දී පරිසරයේ සජීවී බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදි භාෂාව භාවිත කිරීමට සමත් වී ඇත. උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

## අපේක්ෂිත පිළිතුර

සජීවි බව මැනවින් නිරූපණය කිරීමට උචිත පරිදි භාෂාව භාවිත කිරීමට සමත් වී ඇත.

ස්වාභාවික වස්තූන්ට සජීවි බවක් ආරෝපණය කිරීමට කවියා ගත් උත්සාහය සඳහා පහත සඳහන් නිදසුන් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.


| | | |
|---|---|---|
| 1. | සංගීතවත් වී යම් ඉදිරියට | ගලා........ |
| 2. | "සැඟවෙමි - එබෙමි - නිසසල වෙමි - සසල | වෙමි..... |
| 3. | මී අඹ - කිරල - මාදම් ගෙඩි ළඳරු | වියේ..... |
| 4. | හිරිමල් සිනා රැළි පෙණ පිඩු | මිහිරිතම...... |
| 5. | කෙකටිය ඕලු නළියන දිය රැළි | මැද්දෙන් |
| 6. | කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල | කොට |

(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)

(නිදසුන් 3 ක් ඉදිරිපත් කරමින් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය. ගැළපෙන වෙනත් නිදසුන් ද පිළිගන්න.)


**උදාහරණ සඳහා ලකුණු 03 යි**
**සමස්ත විස්තරයට ලකුණු 07 යි**
**මුළු ලකුණු 10 යි**

## 7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන




ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය පාදක කරගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 25%කි. මෙහි සමස්ත පහසුතාව 66%කි. ලකුණු 10ක් හිමිවන මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් ලකුණු ලබාගෙන ඇති ආකාරය බලන කල

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයෙන් 9%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයෙන් 10%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයෙන් 24%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයෙන් 57%ක් ද,
ලබාගෙන ඇත.





ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය ඇසුරෙන් පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන් අතුරෙන් ලකුණු 6ට වඩා අඩුවෙන් ලබාගෙන ඇති සංඛ්‍යාව 19%කි. එම 19% අතරෙන් 00ත් 02ත් අතර ලකුණු ලබාගෙන ඇති සංඛ්‍යාව 9%කි. ලකුණු 6ත් හෝ 10ත් අතර ලබාගෙන ඇති සංඛ්‍යාව 81%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටමක තිබූ බව යි.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 25%ක් වුවත් එහි පහසුතාව 66%ක් වීමෙන් පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නය තෝරාගත් අයදුම්කරුවන් මධ්‍යස්ථ මට්ටමක ලකුණු ලබාගෙන ඇති බව යි.

* පිළිතුරු සැපයීමේදී III වන ප්‍රශ්න පත්‍රය පිළිබඳ ව පොදුවේ බලන කල වැඩිම පහසුතාව ලබාගත් ප්‍රශ්නය ලෙස 7 වන ප්‍රශ්නය දැක්විය හැකි ය. එහි පහසුතාව 66%කි.

1, 5, 4, 3 යන ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 61%, 60%, 56%, 55% වන අතර එය ප්‍රශස්ත මට්ටමකි. අඩු ම පහසුතාවක් දක්වන්නේ 6, 2 ප්‍රශ්න යි. ඒවායේ පහසුතාව පිළිවෙළින් 41% හා 38% වේ. ඉන් පැහැදිලි වන්නේ පුරාතන ගද්‍ය පද්‍ය පිළිබඳ ව මෙන් ම පරිවර්තන සාහිත්‍යය පිළිබඳ ව ද අයදුම්කරුවන්ගේ ඇති අනවබෝධය යි.

සිංහල භාෂාව හා සාහිත්‍යය ප්‍රශ්න පත්‍රය දෙස සමස්තයක් වශයෙන් බලන කල්හි ප්‍රශ්න පත්‍ර තුනෙහි සමස්ත පහසුතාව පහත පරිදි වේ.
I ප්‍රශ්න පත්‍රයෙන් සමස්ත පහසුතාව 55%කි.
II ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 55%කි.
III ප්‍රශ්න පත්‍රයෙහි සමස්ත පහසුතාව 56%කි.



## III කොටස

### 3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

### 3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

**පොදු උපදෙස්**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතුය. තවද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයූවා දැයි සුපරීක්ෂාකාරී විය යුතු ය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නො කිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නො කළ යුතුය. අදාළ අවස්ථාවල දී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතු ය.

* පිළිතුරුවල අන්තර්ගත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතු ය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි බැවිනි.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංශ) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- ★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාර භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතු ය.

- ★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදි ව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතු ය.

- ★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳව 10, 11 ශ්‍රේණිවල පෙළපොත්වල අදාළ පාඩම් දෙකෙහි දැක්වෙන අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේදී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතු ය.

- ★ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නො වන බැවින් මනා ඉගැන්වීම් ක්‍රම මගින් භාවිත හැකියාව නැංවීමට පියවර ගත යුතු ය.

- ★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහුඅර්ථ පද ඇතුළු වාක් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතු ය.

- ★ ව්‍යාකරණ ඉගැන්වීමේ දී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරෙන් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතු ය.

- ★ රචනා ලිවීමේදී ව්‍යූහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳ ව 10 වන ශ්‍රේණියේදී ම මග පෙන්වීම කළ යුතු ය.

- ★ ප්‍රායෝගික ලේඛන ලිවීමේදී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතු ය.

- ★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතු ය.

- ★ සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩ ප්‍රස්තා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතු ය.

- ★ බාහිර පොත් පත් කියවීමට පෙලඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතු ය.

- ★ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතු ය.

- ★ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

- ★ අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතු ය.

- ★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍ය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

- ★ සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහි ලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතු ය.